# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

07 කාණ්ඩය 05 කලාපය

2021 මැයි



05 කම්කරු දිනයේ නැගෙන විමුක්ති දේශපාලනය

08 වලංගු නොවූ ජීවිතවලට ක්ෂුද්‍ර මූල්‍ය විලංගු

10 පොල්තෙල්වල වස... අපි මොකද කරන්නෙ?

11 පෙ.ස.ප. කම්කරු දින පණිවුඩය



පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ආධාරය රු 30.00


## කොළඹ වරාය නගරය

# ලෝක ජාවාරම්කරුවන්ගේ තිප්පොළක් වන ලකුණු

**කොළඹ වරාය නගරය මුල සිටම අධිරාජ්‍යවාදීන්ගේ සහ ලෝක බලවතුන්ගේ කලාපීය බල පොරයටත් නව ලිබරල් ආර්ථික කොල්ලයටත් ලාංකීය ජනතාව බිලි දීම සඳහා සැලසුම් කෙරුණු විනාශකාරී ව්‍යාපෘතියකි. මේ වන විට එය ලෝක ජාවාරම් කරුවන්ගේ තිප්පොළක් බවටද පත්වීමේ පෙර නිමිති පහළ වෙමින් පවතී. 'කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කොමිෂන් පනත් කෙටුම්පත' පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු අතර එම කෙටුම්පත විමසිල්ලෙන් අධ්‍යයනය කිරීමේදී මේ බව අනාවරණය වේ.**

කොළඹ වරාය නගර කොමිෂන් සභා පනත අනුව ලංකාවේ දනට ක්‍රියත්මක වන පනත් 13ක් නිදහස් කිරීමේ හෝ දිරිගැන්වීම සිදු කෙරෙන අතර කිසිසේත්ම අදාළ නොකරගත යුතු පනත් 7ක්ද නම් කර තිබේ. එසේ නිදහස් කිරීමේ හෝ දිරිගැන්වීම් ප්‍රධානය කරන පනත් අතර 2002 අංක 11 දරන මුදල් පනත 2005 අංක 5 දරන මුදල් පනත 1989 අංක දරන සුරාබදු විශේෂ විධිවිධාන පනත 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීමේ හා සූදු බදු පනත 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමේ පනත ඇතුළු පනත් ගණනාවක් ඇතුළත් කර ඇත. විශේෂයෙන්ම නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සිදුකර ඇති මුදල් පනත් සලකා බැලීමේදී නීති විරෝධී ලෙස නොයෙකුත් අයථා ක්‍රම මගින් උපයා ගත් මුදල් සහ මහා පරිමාණයෙන් බදු මුදල් පැහැර හැරි වංචනිකයන්ට සිය කළු සල්ලි වරාය නගරය තුළ නීත්‍යානුකූල භාවයක් ලැබීමත් එවැනිම ලෝක ජාවාරම්කාරයන්ගේ මුදල් හුවමාරු වන තිප්පොළක් බවට කොළඹ වරාය නගරය පත්වීමත් වැළැක්විය නොහැකි වනු ඇත.

මේ අතර මෙම මූල්‍ය නගර ව්‍යාපෘතිය මගින් අමෙරිකානු ඩොලර් බිලියන 15ක විදෙස් මුදල් ආයෝජනයක් ඉදිරි වසර 5 තුළ බලාපොරොත්තු වන බව ආණ්ඩුවේ ප්‍රධානීන් ප්‍රකාශ කර ඇත. නමුත් 1977 නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමෙන් අනතුරුව මෙරටට පැමිණි විදෙස් මුදල් ආයෝජන හරහා උපයාගෙන ඇති විදේශ මුදල් විනිමය ප්‍රමාණය අනෙකුත් විදේශ විනිමය උපයා ☞ 02 පිටුවට










2021 ජාත්‍යන්තර කම්කරු දිනය

2021 ජාත්‍යන්තර කම්කරු දිනය වෙනුවෙන් පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් සංවිධානය කළ කම්කරු දින සැමරුම 'අධිරාජ්‍යවාදී උගුලෙන්, නව ලිබරල් කොල්ලයෙන් ජනතාව ගලවන වැඩකරන ජනතා බලයක්!' යන තේමාවෙන් නුගේගොඩ පක්ෂ කාර්යාල පරිශ්‍රයේ පවත්වා අන්තර්ජාල විකාශයක් සිදුකරන ලදී.

මෙම කම්කරු දින සැමරුමේදී පෙ.ස.ප. ප්‍රචාරක ලේකම් සහ කම්කරු අරගල මධ්‍යස්ථානයේ සංවිධායක ලේකම් දුමින්ද නාගමුව සහ පක්ෂයේ සංවිධායක ලේකම් සේනාධීර ගුණතිලක යන සහෝදරවරු දේශන පැවැත්වූහ.

## හකුළාගත් කොතලාවල පනත යළි පාර්ලිමේන්තුවට

පසුගිය යහපාලන ආණ්ඩුව විසින් 2018 අප්‍රේල් 11 වන දින මුල්වරට ගැසට් කරන ලද 'කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත' සිසුජන විරෝධය නිසා සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර හකුළා ගැණුණි. එම පනත් කෙටුම්පත පසුගිය මාර්තු 26 වැනි දින වත්මන් ආණ්ඩුව විසින් යළි පාර්ලිමේතුවට ඉදිරිපත් කර තිබේ.

සයිටම් හොර උපාධි කඩය අහෝසි කරන ලෙස ගෙනගිය සිසුජන විරෝධතා හමුවේ එහි ලියාපදිංචි සිසුන් අනුයුත්ත කිරීම සඳහා යැයි පවසමින් කොතලාවල ☞ 02 පිටුවට

## අහඹු PCR නවතා වසංගතයේ සැබෑ තතු වසන් කළ බවට ආණ්ඩුවට චෝදනා

දිස්ත්‍රික් මට්ටමින් අහඹු ලෙසසිදු කරමින් තිබූ PCR පරීක්ෂණ නතර කිරීමට ප්‍රාදේශීය වසංගත රෝග නිලධාරීන්ට සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට පසුගිය කාලයේ නියෝග ලැබීම් තිබූ බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය පවසයි. ඒ අනුව ආණ්ඩුව පසුගිය සිංහල හින්දු අලුත් අවුරුදු උත්සව සමයේ ආණ්ඩුවේ ආර්ථික හා දේශපාලන උවමනාවන් මත කොවිඩ් වසංගතය පැතිර යාමේ සැබෑ තතු ජනතාවගෙන් වසංකර තබා ගැනීමට කටයුතු කර තිබේ. අප්‍රේල් 8 වන දින විටත් කොවිඩ් 19 නව ප්‍රභේදයක් පැතිර යමින් තිබෙන බවට ☞ 02 පිටුවට

## ක්ෂුද්‍ර මූල්‍ය ණය අහෝසි කරනු!

## අත්සන් දශ ලක්ෂයේ පෙත්සමක්

ක්ෂුද්‍ර මූල්‍ය ණය වහා අහෝසි කරන ලෙස බලකරමින් 'නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය' විසින් සංවිධානය කර තිබූ අත්සන් දස ලක්ෂයේ පෙත්සමට අත්සන් ලබාගැනීම පසුගිය 23 සහ 24 යන දිනවලදී කළුතර, පුත්තලම, මොනරාගල, අම්පාර, බදුල්ල, පොළොන්නරුව, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලදී සංකේතාත්මකව සිදුවිය. නිදහස උදෙසා කාන්තා ව්‍යාපාරය විසින් 'ගෙවන්න බෑ! ගෙවන්නෙ නෑ! ස්ත්‍රීන් බිලිගන්නා ක්ෂුද්‍ර මූල්‍ය ණය වහා අහෝසි කරනු' යන සටන් පාඨය යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ☞ 02 පිටුවට

# ක්වඩ් රටවල මැදිහත්වීමෙන් ඉන්දියන් සාගරයේ යුද අභ්‍යාස

අමෙරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රේලියාව, ජපානය, ප්‍රංශය සහ ඉන්දියාවේ සහභාගීත්වයෙන් නාවික යුද අභ්‍යාසක් ආරම්භ කර ඇත.

'ක්වඩ්' (QUAD) සංවිධානයට අයත් රටවල නාවික හමුදාවල ශක්තිය වැඩි කර ගැනීමටත් සාමාජික රටවල නාවික හමුදා අතර සම්බන්ධතා ශක්තිය වැඩි කරගැනීමේත් අරමුණ ඇතිව ඉන්දීය සාගර කලාපයේ නැගෙනහිර පෙදෙසේ දී සඳුදා මෙම නාවික යුද අභ්‍යාස ආරම්භ කර ඇත. ඉන්දියාව, අමරිකා එක්සත් ජනපදය, ජපානය සහ ඔස්ට්‍රේලියාවේ මූලිකත්වයෙන් චතුර් ආරක්ෂක සංවාදය ආරම්භ කරන ලද සංවිධානය 'ක්වඩ්' යන කෙටි නාමයෙන් හැඳින්වේ. එය මුල්වරට කරළියට පිවිසියේ 2017 වසරේ දීය.

චීනය විසින් අමෙරිකා එක්සත් ජනදපය අභිභවා ඉන්දීය සාගර කලාපය තුළ සිය මැදිහත්වීම ශක්තිමත් කරගැනීමට උත්සාහ කරන අවස්ථාවක මෙම යුද අභ්‍යාස ආරම්භ විය.

මේ යටතේ ප්‍රංශයේ මූලිකත්වයෙන්ද යුද අභ්‍යාසයක් ආරම්භ වන අතර ඒ සඳහා ඉන්දීය නාවික හමුදාවට අයත් යුද නෞකා දෙකක්ද දිගු දුර සාගර මුර සංචාරවලට යොදා තිබෙන ගුවන් යානයක් ද යොදාගැනේ. මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ඉන්දීය නාවික හමුදාවේ ප්‍රකාශක අණදෙන නිලධාරී විවේක් මාද්වාල් පැවැසුවේ ඉන්දීය හා ශාන්තිකර කලාපයේ සියලුදෙනාගේ සහභාගීත්වය පවත්වාගෙන යෑමටත් එම කලාපය සියලු දෙනාට විවෘත සහ ජාත්‍යන්තර සම්මතයටත් නීතිවලටත් යටත් කලාපයක් බවටත් පත් කිරීමට ඇප කැප වී සිටින බවය.

# වැඩිහිටියන්ගෙන් 76%කට ප්‍රමාණවත් ආහාර නැහැ.

මෙරට වැඩිහිටියන්ගෙන් 73%ක් පමණ ප්‍රමාණවත් පරිදි එළවළු හා පලතුරු පරිභෝජනය නොකරන අතර, වයස අවුරුදු 5ට වඩා අඩු දරුවන්ගේ මන්දපෝෂණ මට්ටමද 21%ක් පමණ වන බව ජාතික විගණන කාර්යාලය 2015දී කළ විගණනයකට අනුව හෙළිව ඇතැයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වී තිබේ.

එසේම වාර්ෂිකව එළවළු හා පලතුරු මෙට්‍රික් ටොන් 270,000ක් පමණ අපතේ යන බවත් එයින් මෙරට ආර්ථිකයට සිදුව ඇති අලාභය රුපියල් කෝටි 2,000ක් පමණ වන බවත් අනාවරණය වී ඇත.

පසුගියදා පාර්ලිමේන්තුවේදී පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණගේ සභාපතිත්වයෙන් පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී එම වාර්තාවේ නිරීක්ෂණ අනුව ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරුවල පසු අස්වනු හානිය සියයට 30-40 ත් අතර ප්‍රමාණයක් බව හෙළිව තිබේ.

එමෙන්ම කෘෂිකර්මයේ සමස්තය ආවරණය වන පරිදි සකස් කළ සම්මත කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවට නොමැති බවද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය.

ඉහත කරුණු අනාවරණය වූයේ ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු සම්බන්ධව පසු අස්වනු හානිය අවම කිරීම හා සාධාරණ මිලට අලෙවිය සඳහා අදාළ රාජ්‍ය ආයතනවල මැදිහත්වීම පිළිබඳ වූ කාර්ය සාධන විගණන වාර්තාව සාකච්ඡාවට ලක් කළ අවස්ථාවේදීය.

01 පිටුවෙන්

## වරාය නගරය...

ගැනීම හා සසඳන කළ 2%ප්‍රතිශතය ඉක්මවා නැත. නිදහස් වෙළෙඳ කලාප හරහා නොයෙකුත් බදු සහන හා කම්කරු නීති ලිහිල් කිරීම සිදු කළද විදෙස් ආයෝජන ගෙන්වා ගැනීමට ඉතිහාසය පුරාම අසාර්ථක වී තිබේ. කොළඹ වරාය නගරය හුදු මූල්‍ය වෙළෙඳපොළ සහ විනෝද සේවා ඇතුළු සේවාය සැපයීම් ආර්ථික කලාපයක් පමණක් වන නිසා විදෙස් මුදල් ඉපයීම අතින් ආණ්ඩුවේ ඉහත ඉලක්ක සපුරා ගැනීම විශ්වාස කළ නොහැක. එමෙන්ම ලෝක ජාවාරම්කරුවන්ගේ තිප්පොළක් බවට පත්වීම තුළ ලාංකීය සමාජ සංස්කෘතියට එමගින් එල්ලවන සමාජ බලපෑමද සුළු පටු නොවේ. කොළඹ වරාය නගරයේ විශේෂ ආර්ථික කලාපය තුළ බලනොපැවැත්වෙන හෝ සංශෝධනයන් සහිතව ක්‍රියාත්මක වන අණපත් සම්පූර්ණ වශයෙන් පහත දක්වේ.

**නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රධානය කළ හැකි පනත්**

1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත
2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත
3. 2002 අංක 11 දරන මුදල් පනත
4. 2005 අංක 5 දරන මුදල් පනත
5. 1989 අංක දරන සුරාබදු විශේෂ විධිවිධාන පනත
6. 2035 වන අධිකාරිය වූ රේගු ආඥාපනත
7. 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ බදු පනත
8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත
9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත
10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ විශේෂ විධිවිධාන පනත 2067 වන අධිකාරිය වූ විනෝද බදු පනත
11. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත
12. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමේ පනත

**කොළඹ වරාය නගරය බල ප්‍රදේශය තුළ අදාළ නොවන පනත්**

1. 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත
2. 252 අධිකාරිය වූ මහ නගර සභා ආඥාපනත
3. 2000 අංක 41 දරන ශ්‍රී ලංකා වාණිජ සමත මධ්‍යස්ථාන පනත
4. 269 අධිකාරිය වූ නගර හා ග්‍රාම නිර්මාන ආඥාපනත
5. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධ ව්‍යාපෘති පනත
6. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත
7. 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත

## හකුළාගත් කොතලාවල...

ආරක්ෂක විද්‍යාපීඨ පනතට සංශෝධනයක් ලෙස මෙම පනත පසුගිය ආණ්ඩුව විසින් රැගෙන එන ලදී. නමුත් එම පනත මිලිටරීකරණය යොදා ගෙන නිදහස් අධ්‍යාපනය වළලා දැමීමක් බව කරුණු සහිත තහවුරු වීමත් සමග එම පනත සඳහා ද ජනතා විරෝධය එල්ල වීම නිසා එය හකුළා ගැනීමට සිදුවිය. කොවිඩ් වසංගතයට මුවාවී විශ්වවිද්‍යාල විවෘත කිරීම දිගින් දිගටම කල් තබමින් සිටින වත්මන් ආණ්ඩුව විශ්වවිද්‍යාල පෞද්ගලිකකරණය කිරීමට අදාළව සියලු අනපනත් සම්මත කරගැනීමේ උත්සාහයක නිරත වෙමින් සිටින බව විප්ලවවාදී ශිෂ්‍ය සංගමය පවසයි. ශිෂ්‍ය ව්‍යාපාරයේ විරෝධතා මගහැර කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත හොර රහසේ සම්මත කර ගැනීමට ආණ්ඩුව දරන උත්සාහාය මගින්ද ඒ බව සනාත වන බව විප්ලවවාදී ශිෂ්‍ය සංගමය පෙන්වාදෙයි.

යෝජිත පනත මගින් ඍජුවම කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික වෛද්‍ය විද්‍යාල සභාව ජාතික ඉංජිනේරු කොමිෂන් සභාව මෙන්ම උසස් අධ්‍යාපන ආමාත්‍යාංශයෙන්ද බැහැරව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන ආයතනයක් බවට පත්වේ. එහි පරිපලනය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පාලන සභාවක් පත් කෙරෙන අතර එම පාලන සභාවට දේශීය හෝ විදේශීය සිසුන් සමග උපාධි පාඨමාලා පවත්වාගෙන යාම සමග සම්බන්ධ වෙමින් උපාධි පාඨමාලා පතවත්වා ගැනීමේ බලතලද හිමි වී තිබේ. ඒ අනුව පෞද්ගලික විශ්වවිද්‍යාල හා සම්බන්ධ වෙමින් උපාධි ප්‍රදානය කිරීමේ හැකියාවක් හිමි වී තිබේ. යෝජිත පනත අනුව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පාලක සභාවේ සෙසු සාමාජිකයන් වන්නේ අරක්ෂක අමාත්‍යාංශ අතිරේක ලේකම් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා ත්‍රිවිධ හමුදා පතිවරු මහා භාණ්ඩගාරයේ නියෝජිතයකු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයකු වේ. ඒ අනුව ආරක්ෂක ඇමැතිවරයා විසින් මෙහෙයවන මිලිටරි ආණ්ඩුව මගින් මෙහෙය වන රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙන් පරිබාහිරව උපාධි ප්‍රදානය කරන ආයතනයක් බවට එය පත්වේ. එහි උපකුලපතිවරයා වන්නේද ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.

## අහඹු PCR නවතා...

සෞඛ්‍ය අංශ අනතුරු අඟවා තිබුණද ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම ආණ්ඩුවේ දේශපාලන අධිකාරිය කටයුතු කර තිබේ.

උත්සව සමයෙන් පසුව වුවද කොවිඩ් වසංගතයේ වත්මන් රැල්ල පාලන කිරීම සඳහා සංචරණ සීමා පැනවීමේ අවශ්‍යතාව සෞඛ්‍ය අංශ පෙන්වාදී තිබියදීත් ඒ සඳහා දේශපලන අනුමැතිය ලබා ගැනීමට තමන් අපොහොසත් වූ බව ප්‍රා,මික සෞඛ්‍ය සේවා වසංග රෝග හා කොවිඩ් මර්දනය පිළිබඳ රාජ්‍ය ඇමැතිනී සුදර්ශණී ප්‍රනාන්දුපුල්ලේ යු ට්යුබ් නාළිකාවකට ලබාදුන් සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රසිද්ධියේ පිළිගෙන ඇත. මේ අතර ඉන්දියාවේ වසංගත තත්වය පාලනය කර ගතනොහැකි තත්වයට පත්වීමත් සමග රට හැර යමින් සිටින එහි ධනවතුන් සඳහා ලංකාව අතර මැදි නැවතුම් මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනිමට ඉඩ ප්‍රස්ථා ලබා ගැනිමට ආණ්ඩුව කටයුතු කරමින් ඇත. ලෝකයේ බොහෝ රටවල් ඉන්දියාව සමග ගුවන් ගමන් නතර කිරීම සමග පෞද්ගලික ගුවන් යානා යොදා ගනිමින් පලාලි ගුවන් තොටුපළට ගොඩ බැසීමට අවස්ථාව ලබාදීමත් දින 14ක නිරෝධායන කාලයකින් පසු කටුනායක ගුවන් තොටුපළ හරහා තමන් කැමැති රටකටය යාම සඳහා ඉඩකඩ ලබාදීමටත් මෙහිදී ආණ්ඩුව කටයුතු කර ඇත.

## ක්ෂුද්‍ර මූල්‍ය ණය...

ණය ගැටලුව වෙනුවෙන් සිදුකරන මැදිහත්වීමේ එක් පියවරක් ලෙස මෙම පෙත්සම අත්සන් කිරීම සිදුකරන ලදී. එසේම ඉදිරියේදී මෙම මූල්‍ය සමාගම්වල ණය මාෆියාවට එරෙහිව පෙත්සමට අත්සන් ලබාගැනීමට අමතරව විරෝධතා , උද්ඝෝෂණ ,ගෘහස්ථ සාකච්ඡා, වාර්තා චිත්‍රපට ප්‍රදර්ශන සංවිධානය කිරීමට බලාපොරොත්තු වෙන බව නිදහස උදෙසා කාන්තා ව්‍යපාරය පවසයි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ස්ත්‍රීන්ද, නාගරික වතු ආශ්‍රිත ස්ත්‍රීන්ද , යුද්ධය නිසා අනාථභාවයට, වැන්දඹු භාවයට පත්වූ ස්ත්‍රීන්ට වතු කම්කරු ස්ත්‍රීන්ද මෙම ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ ප්‍රධාන ලෙස හිරවී සිටියි.

බැංකු හෝ එවැනි විධිමත් මූල්‍ය ආයතන හරහා ණය ලබා ගැනීමට ඔවුන්ට ඇපකර, ඇපකරුවන්, හෝ ස්ථිර ආදායම් නොමැතිවීම එයට ප්‍රධාන හේතුවකි. එවන් වටපිටාවක පිළිසරණ වීමේ මුවාවෙන් 2439000ක් ස්ත්‍රීන්ගේ ජීවිතවලට කඩාවදින ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්, ආයතන කුඩා ණය මුදලක් වෙනුවෙන් ඉතාමත් නින්දිත හා අසාධාරණ ලෙස ගිනි පොලී හා වැල් පොලී අයකරමින් මෙම ස්ත්‍රීන් පීඩාවට ලක් කරමින් සිටියි.මූල්‍ය ආයතනවල තර්ජනයන්ට, ගර්ජනයන්ට හා ශාරීරික, ලිංගික හිරිහැරයන්ට ලක්ව තවදුරටත් ජීවිතයට මුහුණදීමට අසමත්ව සියදිවි හානි කරගත් ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව 200 ඉක්මවා තිබේ.

# චීන ආරක්ෂක ඇමැති ලංකාවේ දෙදින නිල සංචාරයක

චීන ආරක්ෂක ඇමති ගෙයිපෙන් පසුගියදා ලංකාවේ දෙදින නිල සංචාරය නිරත විය.

මෙම සංචාරය තුළ ඉහළ පෙළේ රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡා පැවැත් වූ අතර එහිදී ලංකාව තුළ පැමිණි ගිවිසුම් හෝ එකඟතා මොනවාදැයි යන්න පවත්පත මුද්‍රණය කරන අවස්ථාව වන විට පූර්ණ වශයෙන් අනාවර්ණය වී නොතිබිණි. විශේෂයෙන්ම චීන ආරක්ෂක ඇමැතිවරයාගේ මෙම සංචාරය පිළිබඳ දැඩි අවධානය ඉන්දියාවට යොමුවී තිබේ.

මේ අතර චීන රජය මගින් ලංකාවේ පොලිසිය සඳහා නව ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් පානය කෙරෙන බව වාර්තා වී තිබේ. මෙම විශේෂ ගුවන් විදුලි පද්ධතිය තුළින් පොලිස් දෙපාර්තමේන්තවේ විවිධ නිලධාරින් අතර රහස් පණිවුඩ හුවමාරු කර ගැනීමේ හැකියාවක් පොලිස්පති වරයාට හිමිවේ.

# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත
අංක 22/1, මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ.
flsocialistparty@gmail.com
wama.editor@gmail.com


# සාහසිකත්වයට අලුත් ඇඳුම් ඇන්දවීම

ඇතුන් ලවාවත් ඇද්දවිය නොහැකි අර්බුදයක ආණ්ඩුව කරවටක් ගිලී සිටින බව අප ලියා තැබුවේ ගිය මාසයේ කතු වැකියේය. අර්බුදයන් හමුවේ මීට පෙර සිටි හැම පාලකයෙක්ම ගත් මග යමින් ඊට උන්ගේ පිළිතුරු සෙවීමට වත්මන් පාලකයෝද ලක ලෑස්තිවන සෙයකි.

බලයට පත් වන සමයේ පසේ බුදුවරුන්ට අඳින්නට කැමති කොයි පාලකයාත් වැඩිකල් නොගොසින් දේවදත්තලාට අඳින බව අපි දන්නේ අද ඊයෙක සිට නොවේ. කොළ කඩා පෑම් නොකලාට වෙමින් තිබෙන මේ නව පෙළගැස්මවල් හරහා ගොනා හැරෙන්නේ පොල්පැළය වෙතටම බව අප අද ලියා තබන්නේ එහෙයිනි.

තමන්ගේ පදයට නටන තත්වයට සමාජ මාධ්‍ය හසුරුවාලීමේ උවමනාවක් ආණ්ඩුවට තිබුණේ අද ඊයේ නොවේ. සමාජ මාධ්‍යයට ලියූ කිහිප දෙනෙක්ම මර්දන දඬුකඳේ ගසා ආණ්ඩුව අත්හදා බලනු ලැබුවේ එකී උවමනාවය. එහෙත් ඉන් පලක් නොවූ තැන ඒවා සීල් තැබීමේ පරණ පාලකයන්ට ආ දොළදුකම දැන් වත්මන් පාලකයන්ටද ඇතිවී තිබේ. සමාජ මාධ්‍ය නියාමනය කිරීමේ මුවාවෙන් ආණ්ඩුව දැන් සූදානම් වන්නේ එකී ප්‍රජාතන්ත්‍ර විරෝධී අභ්‍යාසයටය. දැනටමත් කැබිනට් මණ්ඩලය සිය අනුමැතිය දැත් ඔසවා ඊට ලබා දී තිබේ.

නයාට අඳුකොළ තරමටම උද්දච්ච පාලකයන්ට ප්‍රජාතන්ත්‍රවාදයත් රුස්සන්නේ නැත. සමාජ මාධ්‍ය තහනම් කිරීම හරහා අහෝසි වන්නේ ඒවායේ ලියන, උන්ගේ ප්‍රකාශන අයිතිය පමණක් නොවේ. සත්‍යය සහසුද්දෙන් දැනගැනීමට රටක ජනතාවක් සතු අනුලංඝනීය අයිතියද ඒ හා සමගම වැළලෙන බව අප තේරුම් ගත යුතුය.

හමුදාවට පොලිස් බලය පවරන ගැසට් පත්‍රය නැවතත් නිකුත් වන්නේ ඒ අල්ල පනල්ලේමය. පොලිස්පතිගේ ප්‍රධානත්වයෙන් සියලු දේශපාලන පක්ෂ රැස්වී මැයි දිනයට පිට්ටනි වෙන් කරවාගෙන එකී තීරණයේ තීන්ත වේළීමටත් පෙරම හමුදාපති සහ ආරක්ෂක ලේකම් එකතුව මැයි දින රැළි තහනම් කරනුයේ ඒ ආදර්ශය පෙරට ගනිමිනි..

ජනතාවගේ පෞද්ගලික තොරතුරු එක් රැස් කිරීමට ග්‍රාම නිලධාරීන්ට විශේෂ දැනුම් දීමක් කෙරෙන්නේත්, එකී තොරතුරු නොදෙන පුද්ගලයින්ගේ නම් ඡන්ද හිමි නාම ලේඛනයෙන් ඉවත් කිරීමටත් ඒ සඳහා බලපෑම් නොකරන ග්‍රාම නිලධාරීන්ට දඬුවම් කිරීමටත්, උපදෙස් පත්‍රිකා නිකුත් වන්නේත් උන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූලවය. මේ පුද්ගලික තොරතුරු ලබා ගන්නේ උන්ට අනුව ත්‍රස්තවාදයට යළි හිස එසැවිය නොහැකි රටක් හැදීමටය..ත්‍රස්තවාදය හැම විටම වැඩුනේ උන්ගේම තුරුලේ බව අද වනවිට උන්ටත් අමතකව ඇත.

බූරුවන්ගේ බූරුකම් ගැන ලියන විට එයින් කෝපයට පත් බූරුවෙක් ඊසොප් හමුවට පැමිණ විමසා තිබුණේ බූරුවා නුවනක්කාර සතෙක් ලෙස කිසිදාක නොලියන්නේ මන්ද යන්නයි.. එවිට ඊසොප් පවසා තිබුණේ තමන්ට එසේ ලිවිය හැකි වුවද එය කියවන වුන් තමන් බූරුවෙක් ලෙස සැලකීම අනිවාර්ය බවය. දැන් පාලකයින් අපෙන් අසන්නේත් එවැනි දෑය. වනාන්තර විනාශය ගැනම නොලියා සංවර්ධනය ගැන ලිවිය නොහැක්කේ මන්දැයි උන් අපෙන් විමසති. ආණ්ඩුවේ හොරණෑවන්ට එරෙහිව අප හඬ නගන විට සමබර මාධ්‍ය මෙහෙයුමක් ආණ්ඩුව ක්‍රියාත්මක කරන බව නොපවසන්නේ මන්දැයි ඔවුහු විමසති. නග්න ජාතිවාදය වපුරමින් එය සංහිඳියාව සේ දකින්නැයි අපට පවසති.

අප එක් දෙයක් අවධාරණයෙන් යුතුව ඔවුනට පැවසිය යුත්තෙමු. එනම් උන්ගේ දේශපාලනයට හෘද සාක්ෂිය අදාළ නොවූවද අපේ දේශපාලනයට එය ඉහළින්ම අප අදාළ කරගන්නා බවය.

බුරන බල්ලන් හපා නොකන බවට මෙරට පැරණි ආප්තෝපදේශ ඇතත් හපා කන බල්ලන් නොබුරා සිටි බවට ඒ ඉතිහාසයේ කොතනින්වත් සාක්ෂි ලැබී නැත. එබැවින් හපා කෑමට සැරසෙන බල්ලන් සමගම බුරා පනින බල්ලන්ද බැඳ තැබීමට ජනතාව පෙරට ආ යුතු මොහොතක් එළැඹෙමින් ඇති බව ලියා තැබීමට අප කැමැත්තෙමු.

# රැලි පිට රැලි නැගෙනා කොරෝනා වෛරසයේ අලුත් තත්වය

කොරෝනා වෛරසයේ අලුත් රැලි සහ ධනවාදයේ හැසිරීම පිළිබඳව ඔබේ අවධානය යොමු කරමු. පළමු රැල්ල හමා ආවේ මැතිවරණයත් සමගය. ඒ නිසා ආණ්ඩුව 'සුපේෂල' හැසිරීමක් පෙන්නුම් කරන්නට විය. එහිදි ආණ්ඩුවේ මැදිහත්වීම ගැන ලොකු අප්‍රසාදයක් ගොඩනැගුනේ නැත.

දෙවැනි රැල්ලෙදී ජනතාව පිළිබඳව කිසිදු සොයා බැලීමක් නොවීය. ඇතැම් ප්‍රදේශ හුදකලා කිරීම නිසා කුසගින්න දරාගත නොහැකි විය. එම නිසා මිනිසුන් ආහාර ඉල්ලා උද්ඝෝෂණ කරන්නට විය.

තෙවැනි රැල්ලේ ආරම්භය තැබුවේ පසුගිය අප්‍රේල් අවුරුදු සමයත් සමගය. ස්වාභාවික කොහාගේ හඬට වඩා පටිගත කරගත් හඬ සෑම මාධ්‍යයකම ප්‍රචාරයවිය. වෙළෙඳ දැන්වීම් ඉහවහා ගොස්ය. කොරෝනා බිය තුරන්විය. මිනිසුන් සාප්පු සවාරි හිතු හිතු ලෙස සැරිසැරීය. කොරෝනා වසංගතය යොදාගෙන ජනතා උද්ඝෝෂණවලට රාජ්‍ය මර්දනය එල්ල වුවත් රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන පවා සංවිධානය කළ අවුරුදු සැනකෙළි සඳහා කිසිදු තහනමක් නොවීය.

දැන් එහි ප්‍රතිඵලයක් ලෙස රෝහල්වල දැඩි සක්කාර ඒකක පිරීගොස්ය. ඉදිරියේදී ඉන්දියාවට මෙන් ලංකාවට ඔක්සිජන් හිඟතාව නිසා ළමා හා තරුණ පුද්ගලයන්ට පවා මරණවලට ගොදුරුවීමේ අධිඅවධදානම් තත්වයක් දක්වා වර්ධනය විය හැකිය.

සෞඛ්‍ය අංශ පවසන පරිදි මෙම වෛරසය මාසයකට දෙවතාවක් මාරුවේ. මෙබඳු පසුබිමකදී පවා පසුගිය අප්‍රේල් මාසය වෙළෙඳ සාප්පු ජනතාවගෙන් පිරී ගිය මාසයක් විය.



අනෙක් පැත්තේන් දැනට අසාමාන්‍ය රෝගී ලක්ෂණ තිබෙන පුද්ගලයන් අවුරුදුවලට පෙර සිට ලංකාවෙන් වාර්තා විය. එන්නත්කරණය ගැන සෞඛ්‍ය ඇමතිනි පවිත්‍රාදේවි වන්නිආරච්චි අප්‍රේල් 21 වන දින පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළේ "ඕනෑම එන්නතකින් සංකූලතා ඇතිවිය හැකි බව ප්‍රත්‍යක්ෂ කරුණක් බවයි. 'ඇස්ට්‍රා සෙනෙකා' එන්නත ලබාදී සති කිහිපයක් ඇතුළත රුධිරය කැටි ගැසීමේ රෝගීන් සමහර රටවලින් වාර්තා වී ඇත. ලංකාවේත් එවැනි අවස්ථා හයක් වාර්තා වේ. ඉන් තුන්දෙනෙක් මරණයට පත්වී ඇත."

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතා, ප්‍රතිශක්තිකරණ හා සෛල ජීව විද්‍යා ඒකකයේ අධ්‍යක්ෂ වෛද්‍ය චන්දිම ජීවන්දර ඇතුළු කණ්ඩායම පවසන්නේ එක්සත් රාජධානියේ SARS-CoV-2 (B.1.1.7) ප්‍රභේදයට විශේෂිත වූ විකෘතියක් ලංකාවෙන් අනාවරණය වී ඇති බවයි. මෙය පැතිරීවීම වේගවත් බවෙන් ඉහළය. මුල් වෛරසයේ භයානක කම තිබුණේ සංකූලතා වැඩිවන්නේ වයස්ගත අයට සහ වෙනත් ලෙඩරෝගවලින් පෙළෙන අයටය. අලුත් ප්‍රභේදය නිසා ළමා, තරුණ හැමෝටම මාරාන්තික බලපෑම් ඇතිවේ. මේ තත්වය අනුව පෙණහළු සංකූලතා වැඩියි. බොහෝ අයට ඔක්සිජන් දිය යුතු තත්වයක් උදා විය හැකි වන බවට සෞඛ්‍ය අංශ පෙන්වා දී ඇත.

නවතම වාර්තාවලට අනුව බ්‍රසීලයේ සහ එංගලන්තයේ අලුත් කොරෝනා ප්‍රභේද කීහිපයක් ඇති වී ඇත. ඉන්දියාවේ නව විකෘති ප්‍රභේදයක් හටගෙන තිබේ.

දැන් එන වෛරස්වල තත්වය රෝගයේ දරුණුකම වැඩිවේ. ඒ නිසා දැනට ලබාදී ඇති එන්නතට ප්‍රතිවිරෝධයක් දැක්විය හැකිය. ඒ නිසා මුල් එන්නත් මාත්‍රාවල ප්‍රයෝජනය අඩුවිය හැකි බව විශේෂඥ වෛද්‍ය අංශ වාර්තා කරයි.

දකුණු අප්‍රිකාවේත්, එංගලන්තයෙත් තවත් ප්‍රභේද කිහිපයක් ඇති වී ඇත. එම ප්‍රභේද ඉතා වේගයෙන් පැතිරේ. රෝගය වේගයෙන් පැතිරීම නිසා මිනිසුන් මරණයට පත්වන ප්‍රමාණය වැඩිවේ. එබැවින් අධිඅවදානම් තත්වයට පත්වීමට තිබෙන ඉඩ ඉතා විශාල වේ.

මේබඳු පසුබිමක් තුළින් අප තව දුරටත් තහවුරු කර ගත යුත්තේ මේ පාලකයන්ට පන්දහසේ දීමනා වැනි තාවකාලික සන්දර්ශන පෙන්නුවාට සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වැඩපිළිවෙළක් සැකසිය නොහැකි බවයි. මන්ද ධනේශ්වර ක්‍රමයේ අනිවාර්ය ලක්ෂණය ලාභ අරමුණු කරගෙන ගමන් කිරීම නිසාය. කොරෝනා වෛරසයේ අතිබිහිසුණුම තත්වය තුළ පවා ඔවුන්ගේ වැඩපිළිවෙළ සැකසෙන්නේ ජනතාවාදීව නොව ලාභය අරමුණු කරගෙනය. දෙවැනි රැල්ල මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ඇඟළුම් කර්මාන්ත ශාලාවේ ලාභ අරමුණෙන් සහ තුන්වන රැල්ල අවුරුදු හරහා ලාභ ඉපියීම නිසාත් හටගැනීමෙන් පවා එය පැහැදිලිවේ. ඉදිරියට තව කොරෝනා රෝගීන් වැඩි වීමට ඉඩ තිබෙන්නේත් මෙම සමාජ ක්‍රමය ලාභ අරමුණු කරගෙන ගමන් කරන නිසාය. එය තව තවත් තහවුරු කරමින් පවතින තත්වයෙන් පැහැදිලි වන්නේ ධනේශ්වර ක්‍රමයේ අර්බුදයයි.

# ආඬා යවා තබාලා වල්පත ගෙන බොර දියේ මාළු බෑම



## කොවිඩ් තුන්වන රැල්ල

2020 මාර්තු මාසය අගදී ලංකාවට කොවිඩ් රෝගය පැමිණි අතර ඉන් හරියටම අවුරුද්දකට පසු 2021 අප්‍රේල් මාසයේදී එහි යළි හිස එසවීමක් නිරීක්ෂණය කළ හැකි විය. අප්‍රේල් මුල් සතියේදී වාර්තාගත ආසාදිතයන් ප්‍රමාණය 25%කින් ඉහළ ගිය අතර වහාම පවත්නා තත්වය පිළිබඳ පර්යේෂණයක් සිදු කර අප්‍රේල් මස දෙවන සතියේ සිට නව කොවිඩ් රෙගුලාසි පැනවීම කළ යුතු බව විශේෂඥ මතය විය. ඒ අනුව සිංහල-දෙමළ අලුත් අවුරුද්ද සඳහා කෙරෙන මිලදීගැනීම්, නෑදෑ හිත මිතුරන් බැලීමට යාමේ සංචාර සහ පවුලේ විනෝද ගමන් සඳහා නිරෝධායන රෙගුලාසි බලාත්මක කළ යුතු බවට නිර්දේශ විය. නමුත් ජනාධිපතිවරයා සහ ආණ්ඩුවේ ප්‍රමුඛයන් ජනතාවගේ පීඩනය සමනය කිරීම සඳහා අලුත් අවුරුදු කාල සීමාව තුළ කිසිදු සීමාවක් ක්‍රියාත්මක නොකිරීමේ තීරණයක සිටියේය. එහි ප්‍රතිඵලය වූයේ අලුත් අවුරුදු උත්සවය ආසන්න කාලයේ සාප්පු සංචාර තුළිනුත්, අවුරුදු උත්සව සමයේ ඥාති නිවෙස්වලට යන ගමන් හරහාත්, උත්සව සමයෙන් පසු විනෝද ගමන් තුළිනුත් වෛරසය රට පුරා ව්‍යාප්ත වීමයි. ඉන් අනතුරුව පවා, එනම් මේ පිළිබඳ පැහැදිලි අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් වූ අප්‍රේල් 20වැනිදායින් පසුවත් ආණ්ඩුව අවශ්‍ය ක්‍රියාත්මක පියවර ගත්තේ නැත. නිදසුනක් ලෙස පාසල් වසා දැමීම හෝ කම්කරුවන් සේවයට වාර්තා කිරීමේ සීමා පැනවීම සඳහා රෙගුලාසි නිකුත් නොකෙරිණි. අවම වශයෙන් පොදු ප්‍රවාහන සේවා සඳහා පවා අවශ්‍ය තරමේ සීමාවන් පනවනු නොලැබිණි. ඒ වෙනුවට ආණ්ඩුවේ අවධානය යොමු වූයේ මේ තත්වය භාවිත කර සිය දේශපාලන න්‍යායපත්‍ර ක්‍රියාත්මක කිරීමටය.

මේ බව හොඳින් දර්ශනය වූයේ ජාත්‍යන්තර කම්කරු දිනයට අදාළ මැදිහත්වීමේදීය. අප්‍රේල් මස 19වැනිදා සවස කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ දී සාම්ප්‍රදායිකව පවත්වන කම්කරු දින රැස්වීම් සඳහා අවකාශ වෙන් කිරීමේ දේශපාලන පක්ෂ හා පොලිසිය අතර පවත්වන රැස්වීම පැවැත්විණි. එම රැස්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ද සහභාගී වුවත් කම්කරු දින රැස්වීම් නොපැවැත්වීමට තරම් අවදානම්කාරී වෛරස ව්‍යාප්තියක් පිළිබඳව එහිදී සාකච්ඡා නොවීය. එනම් කම්කරු දින සැමරුම් තහනම් කිරීමේ තීරණයක් ඒ මොහොත වනවිටත් පොලිසියට පවා දැනුම්දී නොතිබිණි.

නමුත් පසුවදා, එනම් අප්‍රේල් 20 උදෑසන තමන් දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කර, කම්කරු දිනයට අදාළ රැස්වීම් පමණක් නොව කිසිදු වැඩසටහනක් නොපැවැත්වීමට තීරණය කළ බව හමුදාපතිවරයා එකවරම නිවේදනය කළේය. ඒ වන විටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය වැනි ආණ්ඩුවේ පාර්ශ්වකාර පක්ෂ තමන් වෙනම කම්කරු දිනය පවත්වන බව නිවේදනය කර තිබිණි. මෙවර කම්කරු දින රැස්වීම් සහ පෙළපාළි පැවැත්වූයේ නම් එහි විශාලතම අවාසිය සිදු වන්නේ ආණ්ඩුවටය. එක අතකින් එමගින් ඒකමිතියක් පෙන්වීමට නොහැකිව ආණ්ඩුවේ කොටස්කරුවන් අතර ඇති මතභේද සමාජය ඉදිරියේ ප්‍රදර්ශනය කෙරෙනු ඇත. එමෙන්ම මෙවර පොදුජන පෙරමුණට විශාල ජන සහභාගීත්වයක් පෙන්වීමද දුෂ්කර වනු ඇත. එපමණක් නොව මෙවර ජාත්‍යන්තර කම්කරු දිනය ආණ්ඩුවේ වැඩපිළිවෙළට එරෙහි සමාජ අතෘප්තිය සහ වැඩකරන ජනතාවගේ විරෝධය ප්‍රකාශයට පත්වන අවස්ථාවක් වීමට ඉඩ තිබිණි. ජාත්‍යන්තර කම්කරු දින වැඩසටහන් තහනම් කිරීමට ආණ්ඩුව තීරණය කළේ මේ දේශපාලන හේතුව මතය. නමුත් ඒ සඳහා කොවිඩ් ව්‍යාප්තියේ සාධකය හේතුවක් ලෙස ඉදිරිපත් කෙරිණි. කොවිඩ් මුවාවෙන් මෙවරද කම්කරු දිනයට අත තැබීමේ ආණ්ඩුවේ පිළිවෙතට එරෙහි වියයුතු බවටද, කම්කරු දින රැස්වීම් පැවැත්විය යුතු බවටද පක්ෂය තීරණය කරනු ලැබුවේ ඒ අනුවය.

## ආණ්ඩුවේ ගමන් මග

මේ වනවිට ලංකාව දැවැන්ත ආර්ථික අර්බුදයකට ගොදුරුව සිටී. රටේ නිෂ්පාදනය පහත වැටී තිබේ. විදේශ රටවලින් කෙරෙන ආනයන දැඩි සීමාවකට ලක් කළද විදෙස් සංචිත වේගයෙන් දිය වෙමින් යයි. 2019 අවසානය වනවිට ඩොලර් බිලියන 7.6ක්ව තිබූ නිල විදේශ සංචිතය 2021 වර්ෂය ආරම්භ වනවිට ඩොලර් බිලියන 4.5 දක්වා කඩා වැටී තිබේ. මේවාට ආණ්ඩුව සතු විසඳුම් ඇත්තේ කිහිපයක් පමණි. එකක් ජනතාව මත බදුබර වැඩි කිරීමයි. නමුත් බදු බර වැඩි කිරීම නිසා උද්ධමනය වැඩි වෙමින් පවතී. අප්‍රේල් මාසය තුළ එක්සත් ජනපද ඩොලරය රුපියල් 200 සීමාව ඉක්මවමින් රුපියල අවප්‍රමාණ වීම නිසා ආනයනික භාණ්ඩවල මිලද ඉහළ යාම ප්‍රශ්නය තවත් උග්‍ර කළේය. සිංහල - දෙමළ අලුත් අවුරුදු උත්සවය වනවිට සහල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 110-200 අතර මිලකටද, පොල් ගෙඩියක් රුපියල් 110-130 අතර මිලකටද ඉහළ නැගිණි. කප් පරිප්පු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 230ක්, මුං ඇට කිලෝග්‍රෑම් 1ක මිල රුපියල් 950ක්, කහකුඩු කිලෝග්‍රෑම් 1ක මිල රුපියල් 6500ක් ආදී ලෙස ඉහළ නැගිණි. අත්‍යවශ්‍ය ඖෂධ මිල, ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල, රෙදිපිළි මිල ආදියද අහස උසට නැගිණි. වැඩිවන ජීවන වියදම හමුවේ ජනතාව විශාල දුෂ්කරතාවකට පත් විය. ආණ්ඩුවේ අනෙක් විකල්පය වූයේ මුදල් මුද්‍රණය කිරීමයි. සාමාන්‍යයෙන් වාර්ෂිකව අලුතින් මුද්‍රණය කරන මුදල්වල වටිනාකම රුපියල් බිලියන 3-5 වැනි අගයක් වුවත් 2020 වසරේදී රුපියල් බිලියන 659ක් වටිනා මුදල් මුද්‍රණය කර තිබිණි. 2021 පළමු මාස තුනේ මුදල් මුද්‍රණය රුපියල් බිලියන 150ට ආසන්න වී තිබිණි. අප්‍රේල් මාසයේ දෙවන සතියේ පවුල් ලක්ෂ 30කට රුපියල් 5000 බැගින් ලබාදීම සඳහා නැවත මුදල් මුද්‍රණය කළ බව මාධ්‍ය වාර්තා කර තිබිණි. මේ ආකාරයට මුදල් මුද්‍රණය කිරීම නිසා රුපියල අවප්‍රමාණ වීම, උද්ධමනය ඉහළ යාම ආදී අනිටු ප්‍රතිඵල රැසක් අත්විඳීමට සිදුවනු ඇත.

ආණ්ඩුවේ අනෙක් විකල්පය වූයේ ණය ලබා ගැනීමයි. නමුත් වාණිජ බැංකුවලින් ලංකාවට ණය ලබා ගැනීම අපහසු වූයේ ෆිට්ච් රේටින්, මූඩීස් රේටින්, ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් රේටින් වැනි ලොව ප්‍රමුඛතම ණය ප්‍රමිතිකරණ ආයතන ලංකාව අසාදු ලේඛනගත කළ බැවිනි. ඒ නිසා ණය ලබා ගැනීමට සිදුවූයේ අමෙරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව වැනි රටවලිනි. මහ බැංකු වාර්තාවට අනුව 2021 ජනවාරියේ ඩොලර් මිලියන 52ක්ද, පෙබරවාරියේ ඩොලර් මිලියන 145ක්ද දිගුකාලීන ණය ලෙස ලබාගෙන ඇත. 2020 දෙසැම්බරයේ දිගුකාලීන ණය ඩොලර් මිලියන 1573ක් සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හරහා තවත් ඩොලර් මිලියන 4400ක් ණය ලබාගෙන තිබිණි. අප්‍රේල් මාසයේදී චීනයෙන් තවත් ඩොලර් මිලියන 500ක ණයක් ලැබිණි. මෙලෙස ණය ලබා ගැනීම නිසා කෙටිකාලීනව ඉස්පාසුවක් ලැබුණත් ගෙවිය යුතු ණය-පොලී වාරික ඉහළ යාම නිසා දිගු කාලීන අපහසුතා තවත් වැඩිවේ. ආණ්ඩුවේ අනෙක් උත්සාහය වූයේ විදේශ ආයෝජන හෙවත් ගෝලීය ප්‍රාග්ධනය කැඳවීමයි. එලෙස ගෝලීය ප්‍රාග්ධනය කැඳවීම සඳහා කම්කරු නීති, පරිසර නීති, මූල්‍ය නීති මෙන්ම වෙනත් ඕනෑම දෙයක් කැප කිරීමට ආණ්ඩුව පසුබට නොවන බවට වන හොඳම උදාහරණය කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් පනත් කෙටුම්පතයි.

එම පනත් කෙටුම්පතින් පෙනෙන්නේ රටේ සාමාන්‍ය නීතිය අදාළ නොවන වෙනම භූමියක් නම් කර ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමේ උත්සාහයක් පවතින බවයි. එය සම්මත කර ගැනීමට උත්සාහ දරනු ලැබුවේද හොර පාරෙනි. පනත් කෙටුම්පත අප්‍රේල් 8වැනිදා පාර්ලිමේන්තුවේ සභාගත කළ අතර ඊට එරෙහිව පෙත්සම් ඉදිරිපත් කිරීමට ඉතිරිව තිබුණේ අප්‍රේල් 15 දිනය පමණි. මේ තත්වය හමුවේ පක්ෂයට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පනත අභියෝගයට ලක් කිරීමේ අවස්ථාව අහිමි වුවත්, පසුව පක්ෂය වෙනුවෙන් දුමින්ද නාගමුව සහෝදරයා නඩුවට මැදිහත්වීමට ඉදිරිපත් කළ අයදුම්පතට අනුමැතිය ලැබිණි. ඒ අනුව අපගේ අදහස අධිකරණයට ඉදිරිපත් කළ අතර පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ අර්ථකථනය පසුව පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ඇත. නමුත් අධිකරණය තුළ සාකච්ඡා වන්නේ පනත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අතර ඇති අනුකූලතාව පමණක් වන අතර එහි ආර්ථික-දේශපාලන ප්‍රතිවිපාක සැලකිල්ලට ගැනෙන්නේ නැත. ඒ සඳහා පුළුල් මහජන උද්ඝෝෂණයක් සඳහා අප ඉදිරිපත් විය යුතුව තිබේ. වරාය නගර කොමිෂන් පනත හරහා ලංකාව ජාවාරම්කරුවන්ගේ තිප්පොළක් හා ඉන්දියානු සාගරයේ භූ දේශපාලන බල පොරයේ ගොදුරු බිමක් බවට පත් වීමට නියමිත නිසා ඊට එරෙහි පුළුල් මහජන ව්‍යාපාරයක් වෙත ප්‍රවේශය ගත යුතුය.

# කම්කරු දිනයේ නැගෙන විමුක්ති දේශපාලනය



හේමාකට් කම්කරුවන් වෙත, ඓතිහාසිකව පැටවෙමින් තිබුණේ හැකිතරම් දින ගණනක් හැකිතරම් වෙලාවක් ශ්‍රමය වැගිරීමට කරන බල කිරීමකි. ගෙවීගිය සියවසකටත් වඩා වැඩිකාලයක් පුරාත් මේ මොහොතේත් ධනවාදය තුළ කම්කරුවාගේ ශ්‍රමය පිළිබඳ ඇත්තේ එවන් කොන්දේසි විරහිත බලකිරීමකි. එක් පැත්තකින් ධනවාදයේ නිසග ලක්ෂණයක් වන අතර, එමෙන්ම ඊට පෙරළා ලෝක පරිමාණ කම්කරු ජනයා කෙරෙන් පළ වන්නේ ඓතිහාසිකව දිග්ගැස්සුණු අනවරත අරගලයකි.

එදා එක්සත් ජනපද කම්කරුවන් අතරින් නැඟී ගත්තේ චිකාගෝ පමණක් නොව විවිධ භූමිභාගවල දිගින් දිගට පළවු විරෝධතාවල පැහැදිලි අවස්ථාවක් හැටියටය. අසීමාන්තිකව දිනක් තුළ කෙරෙන ශ්‍රම වැගිරීම්වලට එරෙහිව වැඩ කරන නිශ්චිත ශ්‍රම කාලයක් පැය ගණනක් ඉල්ලා සිටීම එකී අරගලයේ ප්‍රධාන ඉල්ලීම විය. ඒ පැය අටක වැඩ දිනයකි. පැය අටක වැඩ දිනයක් ඉල්ලා ඉදිරියට ආ කම්කරුවන් යටත් නොවන තැන පාලකයන් එල්ල කළේ වෙඩි උණ්ඩය.

ඔවුන් සතු වූ ධවල වර්ණ, රතුධජ බවට පත් කරෙමින් අරගලයේ පෙර ගමන්කරුවන් වෙත තීරණාත්මක මර්දනයක් මරණ දණ්ඩනය ගෙන ආ අතර නැඟී ආ උද්ඝෝෂණ හා බල කිරීම් මතින් පැය අටක වැඩ දිනයක පොදු පිළිගැනීමක් දක්වා යාමට ධනවාදයට බල කෙරිණි. එවක් පටන් සියවසකටත් වඩා කාලයක් ගෙවී ගිය ලෝකයක වත්මන් ස්වරූපය කවරේ දැයි යන්න මේ සමගම විමසිය යුතු බරපතළ කරුණකි. ධනවාදය මේ මොහොතේ පවත්නා ස්වරූපයත් ඊට එක එල්ලේ ගොදුරු බවට පත් වන කම්කරු පන්තීන්ගේ තත්වයත් එකට ගෙන මේ සාකාච්ඡාව මතු කළ යුතුය.

නිෂ්පාදන ක්‍රියාවලියේ එතෙක් අත්කර නොගත් මහා පෙරළිය විසින් ලෝකය පුරා සිය අණසක පැතිරූ ධනවාදය විවිධ විද්‍යාවන්ගේත් තාක්ෂණයේත් මෙන්ම නව මෙවලම්වල සොයාගැනීම් ඔස්සේ පෙරළිකාර ජයග්‍රහණ ලෝකය වෙත ගෙන ආවේය.

ලෝකයේ අස්සක් මුල්ලක් නෑර සිය තැනුම් ඒකකය වූ වෙළෙඳ භාණ්ඩය පතුරුවාහල ධනවාදය වෙළෙඳ භාණ්ඩ ලෝකයක් මෙන්ම ඒවා මත ජීවත් වන පරිභෝජනවාදී සංස්කෘතියක්ද, මිනිසෙක්ද නිර්මාණය කළේය. එකී තත්වය ලෝකය ඉදිරියේ නිම වෙද්දී ඒ පසුපසින් මුළුමහත් ලෝකය පුරාත්, විශේෂයෙන් අප්‍රිකානු ආසියානු ලතින් අමෙරිකානු අතිවිශාල මහද්වීප අර්ධද්වීප යා කරමින් දශකයෙන් දශකය මහා අසමානතාවක්ද දරිද්‍රතාවක්ද පාරිසරික සංහාරයක්ද නිර්මාණය කළේය.

බිලියන 8 ආසන්න වෙමින් ඇති ලෝක ජනතාවගෙන් මිලියන 1.4 ජනගහනයක් වෙසෙන ඉන්දියානු අර්ධද්වීපය මේ මොහොතේ අප හට කියා දෙන්නේ එවන් සත්‍යකි. 2020 වර්ෂයේ දී ඉන්දියානු බිලියනපතියන් සංඛ්‍යාව 102 සිට 156 දක්වා ඉහළ යද්දී වරෙක විසඳුම් අන්ධ කාරයෙන්ද, තවත් වරෙක කොවිඩ් වසංගතයෙන්ද වසා දැමෙන උතුරු ඉනදියාවක්, දිල්ලියක් අප ඉදිරියේ නිර්මාණය වී ඇත. නව ලිබරල් ආර්ථික ක්‍රියාවලිය ඉන්දියානු භූමිය සිසාරා නැඟී ගත්තේ 90 දශකයේ පටන්ය. අනතුරුව එය ලෝකයේ වෙනත් රටවල්ද පරයමින් සෞඛ්‍ය, අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර වහා වහා කෙරෙන ලාභ රේට්ටු වෙනුවෙන් වෙන්දේසි දැමීය. ජාතික සෞඛ්‍ය සේවයේ මහා පරිමාණ ඇද වැටීම අද ඉන්දියානු ව්‍යසනයේ ඇති එක් ප්‍රකාශනයක් වන අතර, එය අප බ්‍රිතාන්‍ය ඉතාලිය වැනි රටවල පසුගිය වසරේදී අත් දක්නා ලද කරුණකි.

> **ලොව පුරා බිලියනපතියන්ගේ මහා පරිමාණ ව්‍යාපාර තුළ ලාභ කඳු ගොඩගැසෙන අතර තව තැනක මිලියන ගණන් ජනයා වෙත දරිද්‍රතාවය වැලඳ ගැනීමට බලකෙරී ඇත. එකී ලාභ කඳු ගොඩනැගෙද්දී ඉල්ලා සිටින කොල්ලකාරී පාරිසරික සංහාරය විසින් මිලියන ගණන් ජනයා පාරිසරික අවතැන්වූවන් බවටද තවත් විටෙක වඳවී යාමේ ඉරණමටද ලෝකවාසීන් ගොදුරු කරනවා ඇත.**

ඒ අතර දැනටමත් එක් වසරක් තුළ ලොව සිදුවන දෙවන විශාලතම කාබන් විමෝචනය මේ වසරේදී සිදුවන බවට ගණන් බලා ඇත. ඒ කොවිඩ් වසංගතයේ ආ කෙටි විරාමයකට අනතුරුව ගල්අඟුරු ඇතුළු බලශක්ති විශාල වශයෙන් පාවිච්චියට ගැනීමට ලෝක බලවතුන් විසින් තීරණය කිරීමත් සමගිනි. ඔපෙක් සංවිධානය නොබෝදා ප්‍රකාශ කළේ අලුතින් තෙල් බැරල් මිලියන 200ක් ඉදිරි මාස 03 සඳහා තමන් විසින් මුදා හරින බවකි. මින් කියා දෙන්නේ කවරක්ද? කොල්ලකාරී ආර්ථිකයක් ඔස්සේ කෙරෙන පරිසර කතා ගෝලීය උෂ්ණත්වය පිළිබඳ සමුළු කතා විහිළුවක් බවය.

ලොව පුරා බිලියනපතියන්ගේ, මහා පරිමාණ ව්‍යාපාර තුළ ලාභ කඳු ගොඩගැසෙන අතර තව තැනක මිලියන ගණන් ජනයා වෙත දරිද්‍රතාව වැලඳ ගැනීමට බලකෙරී ඇත. එකී ලාභ කඳු ගොඩනැගෙද්දී නිමාවන පාරිසරික සංහාරය තුළ මුළුමහත් මානව වර්ගයාගේ අවසානය සටහන්ව ඇත. ගොඩනැගෙන අසමානතාවයේ ස්වභාවය නොබෝදා ලෝකය වෙත කියා දුන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධානියා විසිනි. ඔහු කියා සිටියේ එන්නත්කරණයේ දී බරපතළ අසමානතාවක් ගොඩනැඟී ඇති බැවින් කිසිදු ආකාරයක එන්නත්කරණයක් පිළිබඳ කටයුතු කිරීමට අසමත් රටවල් වෙත වහා එන්නත් ලබාදීමේ වැඩපිළිවෙළක් අවශ්‍ය බවයි.

හේමාකට් කම්කරු අරගලයත්, ඉන් අනතුරුව දියත්වූ අරගල ඔස්සේත් ලෝක පරිමාණවම වැඩ කරන ජනයා වෙත අත්කර ගත් මානව හිමිකම්, ජීවත්වීමේ අයිතිය ඇතුළු පොදු මහත් හිමිකම් එකින් එක වළ දැමෙන ලෝකයක් මෙවර කම්කරු දින වන විට ධනවාදය විසින් කැඳවා ඇති කවර දිසාවකින් බැලුවත් කියාදෙන පොදු කතාවක් ඇත. ඒ අතර පසුගාමී ධනවාදයකට හිමිකම් කියන අප සියවස් එකහමාරක් ගතවී ඇතත් වතු කම්කරු ජනයාගේ දිනක වැටුපක්, මාසික වැටුපක් යන්න ඉදිරියේ තවමත් ඇත්තේ අවිනිශ්චිත මානයකය. තවත් පසෙකින් කියා දෙමින් ඇත්තේ විශ්‍රාම වැටුප් ඇතුළු මෙතෙක් සතුවූ අයිතීන් යළි උදුරා ගැනෙන බවය.

මින් අප වෙත ගෙනැවිත් ඇති පොදු සත්‍යය වන්නේ අයිතිවාසිකම් මෙන්ම යළි ජීවිතය අත්පත් කර ගැනීම වෙනුවෙන් ලෝක පරිමාණ කම්කරු ජනයාගේ සමගියක් සමග එක් අරගලයක් ඉල්ලා සිටින බවය.

# අලුත් ආරක්ෂකයන් යෙදවීම නොහොත් නීතියෙන් විළි වසා ගැනීම!



පසුගිය මාර්තු 12 වැනිදා 'ගැසට් රිවස්' යැයි විරුදාවලිය ලැබ සිටින රාජපක්ෂ විසින් අතිවිශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරනු ලැබීය. එහි අරමුණ වූයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ යම් යම් රෙගුලාසි වෙනස් කිරීමය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අනුව ත්‍රස්තවාදය අරුත් ගැන්වෙන්නේ 'ආයුධ සන්නද්ධව' සිදු කරන ක්‍රියාවක් ලෙසයි. ආයුධ සන්නද්ධව කුමන්ත්‍රණය කිරීම, ඝාතන සිදු කිරීමට උත්සාහ කිරීම ආදිය ත්‍රස්තවාදය ලෙස අර්ථ ගැන්වේ.

නමුත් මෙම නව රෙගුලාසි මගින් චිත්‍රයක් ඇඳීම පවා ත්‍රස්තවාදී ක්‍රියාවක් ලෙස අර්ථකථනය කළ හැකිය.

වාර්ගික හෝ ආගමික ගැටුම් ඇතිවේයැයි 'බලධාරීන්ට සිතෙන' ඕනෑම ආකාරයේ වචන, සංඥා හෝ ඒ ආකාරයේ ඕනෑම දෙයක් ත්‍රස්තවාදී ක්‍රියාවක් ලෙස අර්ථකථනය කළ හැකිය. මේ අනුව කිසිදු ත්‍රස්තවාදී ක්‍රියාවකට සම්බන්ධ නැති, ආණ්ඩුවට එකඟ නැති කලාකරුවන්, සමාජ ක්‍රියාකාරිකයන් ත්‍රස්තවාදී ලේබලය යටතේ සිරගත කළ හැකිය.

මෙහි ඊළඟ බරපතළ ප්‍රශ්නය වන්නේ එලෙස ජනාධිපතිවරයාගේ හෝ වෙනත් බලධාරියකුගේ වෛරයට, නුරුස්නාවට පාත්‍ර වන අයකු කිසිදු නඩු විභාගයකින් තොරව වසර දෙකක් දක්වා සිරගත කිරීමට මෙමගින් ඉඩ සලසාගෙන තිබීමයි.

නව සංශෝධනයට අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගන්නා අයකු වසරක කාලයක් සඳහා පුනරුත්ථාපනයට යැවීමට මහෙස්ත්‍රාත්වරය බලය ලබා දී තිබේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ නීතිපතිවරයාගේ ලිඛිත අනුමැතිය පමණි.

නීතිපතිවරයා පත් කරන්නේ ජනාධිපතිවරයා විසිනි. එය දේශපාලන පත්වීමකි. නීතිපතිවරයා බොහෝ විට ඉටු කරන්නේ ආණ්ඩුවේ දේශපාලන උවමනාවයි. සරත් සිල්වා, මොහාන් පීරිස් වැනි අගවිනිසුරන් පවා සිටි රටක නීතිපතිවරයාගේ පාරදෘශ්‍යභාවය හෝ අපක්ෂපාතීත්වය සෙවීම යකඩ මල්ලට හෙණ ගැසූ කල පුළුන් මල්ල සෙවීම වැන්නකි. මෙවැනි ප්‍රශ්න හමුවේ ඇතැම් විනිසුරන් කටයුතු කරන ආකාරය ගැන විවේචන එල්.ටී.ටී.ඊ. සැකකරුවන් ලෙස අත්අඩංගුවට ගත් තමිල් තරුණයන්ට අදාළ නඩු විභාග සම්බන්ධයෙන් සාකච්ඡාවට ලක් විය. ඒ නිසා වචන, වගන්තිවලින්ම පවා රාක්ෂයෙක් ලෙස පෙනෙන පනත ක්‍රියාත්මක වීමේදී කවරාකාර එකක් වේදැයි තේරුම් ගැනීම අපහසු නැත.

මෙලෙස කිසිදු නඩු විභාගයකින් තොරව, විත්තිකරුට හෝ විත්තිකරුගේ නීතිඥයන්ට කරුණු දැක්වීමට අවස්ථාව දීමකින් තොරව වසරක කාලයක් පුනරුත්ථාපනය නමින් සිරගත කරන අයකු තවත් වසරක් සිරගත කිරීමට ආරක්ෂක ඇමතිවරයාට බලය ලබා දී තිබේ. ඒ වසරක ඊනියා පුනරුත්ථාපනය අවසානයේ සකස් කරන වාර්තාවට අනුව ඇමතිවරයා සෑහීමට පත් නොවන්නේ නම් මාස හය බැගින් වාර දෙකක් එනම් තවත් වසරක් දක්වා පුනරුත්ථාපන කාලය දීර්ඝ කිරීමට ඇමතිවරයාට බලය ලබාදී තිබේ.

මේ සියල්ල සිදුවන්නේ නඩු විභාගයකට මුහුණ දී තමන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට වින්දිතයාට අවස්ථාව දීමකින් තොරවය. මෙම නීතිය මගින් ස්වාභාවික යුක්තිය පමණක් නොව පවතින ව්‍යවස්ථාව මගින් සලසා තිබෙන මූලික අයිතිවාසිකම් හා මානව හිමිකම් පවා උල්ලංඝනය කිරීමකි. සාධාරණ නඩු විභාගයකින් පසුව ලබා දෙන නඩු තීන්දුවකින් තොරව සිරගත නොවී සිටීමට ඇති අයිතිය මෙමගින් උල්ලංඝනය කොට තිබේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ගෙනා මෙම සංශෝධන ක්‍රියාත්මකවන ආකාරය ICCPR හෙවත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාත්මක කරන ආකාරට තේරුම් ගත හැකිය. එම පනත යටතේ සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම් හතරක් පිළිබඳව පසුගිය කාලයේ ආන්දෝලනයට ලක් විය. එකක්, ලේඛකයකු වන ශක්තික සත්කුමාර අත්අඩංගුවට ගැනීමයි. ෆේස්බුක් එකට කෙටිකතාවක් ලිවීමෙන් බුදුන්ට අපහාස වූයේ යැයි අභූත චෝදනා එල්ල කරමින් මන්දබුද්ධික චීවරධාරීන් පිරිසක් ගොනු කළ පැමිණිල්ලක් මත ඔහු අත්අඩංගුවට ගනු ලැබීය. දීර්ඝ කාලයක් ඔහු සිරගත කර සිටියේය. ඊළඟ සිදුවීම වන්නේ ධර්මචක්‍රයට සමාන යැයි සැකකරන සලකුණක් සහිත ඇඳුමක් ඇඳ සිටි බව පවසමින් රහීම් මසාහිනා නමැති කාන්තාව පස්සර පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීමයි. ධර්මචක්‍ර සලකුණු සෙල්ලම කොතරම් දුර ගොස් ඇත්දැයි පෙනෙන්නේ නැව් සුක්කානමේ මෝස්තර සහිත ඇඳුම් පස්සෙන් පවා මේ මනෝව්‍යාධියෙන් පෙළෙන්නන් හඹා යනු දකිද්දීය. ඉන් පසුව චින්තන ජිහාදයක් පිළිබඳව ෆේස්බුක් සටහනක් ලියූ රම්සි රසික් අත්අඩංගුවට ගැනීමයි. එමෙන්ම 'නවරසම්' නමින් කවි පොතක් රචනා කළ අහ්නාෆ් ජසීම් නමැති තරුණ කවියාද අත්අඩංගුවට ගනු ලැබීය. අත්අඩංගුවට ගැනීම් පිළිබඳ ඊළඟ ගැටලුව වන්නේ

> **ආණ්ඩුව, අදහස්වලට, අදහස් ප්‍රකාශ කිරීම්වලට කොතරම් බියට පත්ව සිටින්නේදැයි පෙනෙන අනෙක් කරුණ වන්නේ සමාජ මාධ්‍ය සහ මාධ්‍යවේදීන් මර්දනය කිරීමට නව නීති සැකසීමයි. මාධ්‍ය මර්දන පොලිසියක් ලෙස සකසා තිබෙන පුවත්පත් මණ්ඩලය යළි බලාත්මක කර ඊට විද්‍යුත් මාධ්‍ය සහ වෙබ් අඩවි ඇතුළත් කිරීමට ආණ්ඩුව උත්සාහ කරයි. එමෙන්ම වෙබ් අඩවියක් ලියාපදංචි කිරීමේ දී ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමැතිය ගැනීමට සිදුවේ. මෙවැනි නීති සකසන්නේ 'අසනීපෙ හොඳටම වැඩි වූ' විටය.**

රම්සි රසික් මෙන්ම ජසීම්ද ජාතිවාදයට විරුද්ධව අදහස් දක්වන්නන් වීමය. ජසීම් ලියූ කවි අතර ISIS සංවිධානයට විරුද්ධව ලියූ කවිද වන බව ඔහුගේ කවි කියවූ අය පවසති. රම්සි රසික් අත්අඩංගුවට ගෙන ඇත්තේ එක් ෆේස්බුක් සටහනක් සැලකිල්ලට ගෙන වන අතර ජසීම් අත්අඩංගුවට ගෙන ඇත්තේ ඔහුගේ කවි පොත් 'සේව් ද පර්ල්' නමැති සංවිධානයක කාර්යාලයේ තිබූ බව පවසමිනි. අඩුම තරමින් ඔවුන්ගේ ක්‍රියාකාරකම් සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමක්වත් කර නැති බව මින් පැහැදිලිය. මෙම නීති භාවිත වන්නේ කොතරම් අත්තනෝමතිකවද?

ආණ්ඩුව, අදහස්වලට, අදහස් ප්‍රකාශ කිරීම්වලට කොතරම් බියට පත්ව සිටින්නේදැයි පෙනෙන අනෙක් කරුණ වන්නේ සමාජ මාධ්‍ය සහ මාධ්‍යවේදීන් මර්දනය කිරීමට නව නීති සැකසීමයි. මාධ්‍ය මර්දන පොලිසියක් ලෙස සකසා තිබෙන පුවත්පත් මණ්ඩලය යළි බලාත්මක කර ඊට විද්‍යුත් මාධ්‍ය සහ වෙබ් අඩවි ඇතුළත් කිරීමට ආණ්ඩුව උත්සාහ කරයි. එමෙන්ම වෙබ් අඩවියක් ලියාපදංචි කිරීමේ දී ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමැතිය ගැනීමට සිදුවේ. මෙවැනි නීති සකසන්නේ 'අසනීපෙ හොඳටම වැඩි වූ' විටය. නැත්නම් මාධ්‍ය ආයතනයක් ලියාපදිංචි කළ යුත්තේ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ ඇති ආයතනයකය. මාධ්‍ය ආයතනයක් යනු සිකියුරිටි ෆර්ම් එකක් නොවේ.

සිංගප්පූරුවේ ක්‍රියාත්මක වන මාධ්‍ය මර්දන නීති ගැන ආණ්ඩුවේ අවධානය යොමුව තිබේ. එරට නීතියට අනුව ඕනෑම ප්‍රවෘත්තියක් හෝ වාර්තාවක් වෙනස් කරන ලෙස, 'නිවැරදි කරන ලෙස' නියෝග කිරීමට ආණ්ඩුවට හැකිය. මාධ්‍යවේදීන්ට ඩොලර් ලක්ෂ 7ක් දක්වා දඩයකට හෝ වසර 10ක සිරදඬුවමකට යටත් කිරීමට හැකිය.

එක් පැත්තකන් මේ මර්දන නීතිවලින් පෙනෙන්නේ ආණ්ඩුවේ අසමත්භාවයයි. අනෙක් පැත්තෙන් මේ ඇඳුම් අඳින්නේ ඉදිරියේදී නටන්න සූදානම් වන නාඩගමටයි.

# ඉන්දියාවේ කොවිඩ් දෙවැනි රැල්ල



අප්‍රේල් 23 වැනිදා ඉන්දියාවේ කොවිඩ් වෛරස් රෝගීන් 332,730ක් වාර්තා වූ අතර එය මෙතෙක් එක් දිනකදී වාර්තා වී ඇති ඉහළම රෝගීන් සංඛ්‍යාවයි. එය පෙර දින ද එම වාර්තාව බිඳදමා තිබුණි. වසංගතය ආරම්භ වූ දා සිට ඉන්දියාව මිලියන 16 කට වැඩි සංඛ්‍යාවක් කොවිඩ් රෝගීන් සහ මරණ 186,000 කට වැඩි සංඛ්‍යාවක් වාර්තා වී තිබේ. නිල සංඛ්‍යාවන්ට අනුව සෑම දිනකම ඉන්දියාවේ 2,000 කට අධික පිරිසක් කොවිඩ් සමඟ මියයමින් සිටියි. නමුත් මෙය සත්‍යයක් නොවන බවත් දෛනික මරණ සංඛ්‍යාව දැනටමත් 10,000 ඉක්මවා ඇති බවත් ටයිම්ස් පුවත්පත පවසයි.

මෙම වසංගතයේ උත්සන්න වීමට සාපේක්ෂව ඉන්දීය සෞඛ්‍ය සේවය මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ සම්පත් හිඟයයි. මේ වන විට රෝගීන්ගෙන් රෝහල් පිරී ඉතිරී ගොස් ඇතිබවත් රෝහල් රෝගීන් භාර නොගන්නා බවත් වාර්තා වේ. සමාජ මාධ්‍ය හරහා සංසරණය වෙන වීඩියෝ පටවල දැක්වෙන්නේ මිනිසුන් තම ඥාතීන් වෙනුවෙන් ඔක්සිජන් සිලින්ඩර සොරකම් කරන බවයි. ඔක්සිජන් ලබා දීමට නොහැකිවීම නිසා මහාරාෂ්ඨ රෝහලකදී බරපතළ ලෙස රෝගාතුර වූ රෝගීන් විසි දෙනකු ජීවිතක්ෂයට පත්ව ඇති බව 'ටයිම්ස්' පුවත්පත අප්‍රේල් 24 වනදා වාර්තා කර තිබුණි. ඉන්දියාවේ රෝහල් වහාම තමන්ට ප්‍රමාණවත් ඔක්සිජන් සැපයුමක් ලබාගැනීම වෙනුවෙන් අධිකරණය වෙත ගොස් තිබේ. ඉන්දියානු ප්‍රවෘත්ති වෙබ් අඩවියක් jk Scroll.in විසින් කරන ලද පරීක්ෂණයකින් හෙළි වූයේ දිස්ත්‍රික් රෝහල් 150 කට වැඩි සංඛ්‍යාවක් තුළ ඔක්සිජන් උත්පාදන පද්ධති ස්ථානගත කිරීම සඳහා ඩොලර් මිලියන 27 ක කොන්ත්‍රාත්තුවක් සඳහා ලංසු කැඳවීමට වසංගතය ආරම්භ වී මාස අටක් ගතවෙන තුරු එනම් 2020 ඔක්තෝබර් මාසය දක්වා රජය බලා සිටි බවයි. මාස හයකට පසුව එනම් මේ වනවිටත් එම පද්ධති බොහොමයක් තවමත් ක්‍රියාත්මක නොවේ.

ඉන්දියාවේ මතුවූ දෙවැනි කොවිඩ් රැල්ල සඳහා බලපෑ ප්‍රධාන හේතුව වී ඇත්තේ ආගමික අන්තවාදී ඉන්දියානු පාලකයන්ගේ දේශපාලන ප්‍රතිපත්ති මිස වෙන කිසිවක් නොවේ. මාර්තු 11සිට ආරම්භ වූ කුම්භ මේලා හින්දු ආගමික උත්සවයේ කොටසක් ලෙස දස දහස් ගණනක් හින්දු බැතිමතුන් ගංගා නම් ගඟේ ස්නානය සඳහා එක් රැස්වී තිබිණි. මාර්තු මාසයේ දී පාලක භාරතීය ජනතා පක්ෂයේ (BJP) රාජ්‍ය නායකයන් ජාතික පුවත්පත්වල සම්පූර්ණ පිටු ගණන් දැන්වීම් පළ කරමින් පවසා තිබුණේ මෙම ආගමික උත්සවය "පිරිසිදු" සහ "ආරක්ෂිත" බවයි. උත්තර්කන්ඩ් මහ ඇමති මාර්තු 20 වන දින ප්‍රකාශ කළේ, "දෙවියන් කෙරෙහි වූ විශ්වාසය වෛරසයට ඇති බිය මැඩපවත්වන බව අපිට විශ්වාස බවයි. මෙම ආගමික උත්සවයට සහභාගීවීම වසංගතයට එරෙහිව සටන් කිරීමේ "සංකේතයක්" ලෙස තබා ගත යුතු යැයි අගමැති නරේන්ද්‍ර මෝදි ට්විටර් පණිවිඩයක් හරහා ප්‍රකාශ කර තිබුණි.

එසේම කොවිඩ් එන්නත්කරණය සම්බන්ධයෙන් මෝදි ආණ්ඩුව ගෙනගිය ප්‍රචාරණයන්ද මේ වනවිට පුස්සක් බව තහවුරු වෙමින් තිබේ. එන්නත ලබා ගැනීමේ වැදගත්කම සහ විවිධ මිථ්‍යාවන්ට එරෙහිව ජනතාව දැන්වත් කිරීම සම්බන්ධයෙන් ඉන්දියානු රජයට කිසිදු වැඩපිළිවෙළක් නැති බව දක්නට ලැබේ. ඉන්දියානුවන්ගෙන් 65% කට වඩා වැඩි ප්‍රමාණයක් ජීවත් වන ග්‍රාමීය ඉන්දියාවේ බොහෝ අය එන්නත පිළිබඳව සැක පහළ කරන අතර වැරදි තොරතුරු සමාජ මාධ්‍ය තුළ සංසරණය වෙමින් තිබේ. මෝදි විසින්ම මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුකර බටහිර බෙංගාලයේ භාරතීය ජනතා පක්ෂ ප්‍රධානියා පවසා තිබුණේ කොවිඩ් සුවවීම සඳහා ගව මුත්‍රා පානය කරන ලෙසයි. එසේම කොවිඩ් රෝගීන් වැඩි වශයෙන් වාර්තා වෙන මහා රාෂ්ඨ ප්‍රාන්තයේ ප්‍රමාණවත් එන්නත් තොග නොලැබීම නිසා වසා දමා ඇති බව විදෙස් මාධ්‍ය වාර්තා කර තිබේ. විරුද්ධ පක්ෂ නායකයින් ඉල්ලා සිටින්නේ එන්නත් ප්‍රමාණවත් නොමැතිනම් වෙනත් විදේශ එන්නතක් ගෙන්වා ගන්නා ලෙසයි. නමුත් ඒ වෙනුවට ඉන්දීය අගමැතිවරයා ආගමික අන්තවාදය තව තවත් ශක්තිමත් කරමින් සිටියි. පසුගිය අප්‍රේල් මැදදී ට්විටර් පණිවිඩයක් නිකුත් කරමින් ඔහු පැවසුවේ ආරක්ෂාව සඳහා ජනතාව රම් දෙවියන්ගේ ඉගැන්වීම් අනුව ජීවත්විය යුතු බවයි.

# ජෝර්ජ් ෆ්ලොයිඩ් ඝාතනය කළ පොලිස් නිලධාරියාට වසර 75ක සිරදඬුවම්




පසුගිය වසරේ අමෙරිකා එක්සත් ජනපදයේ සිදු වූ ආන්දෝලනාත්මක ජෝර්ජ් ෆ්ලොයිඩ් ඝාතනයේ චූදිතයා වන පොලිස් නිලධාරි ඩෙරික් චාවින්ට එරෙහිව නගා ඇති චෝදනා 03ට වරදකරුවන් බවට පත්කරමින් එරට අධිකරණයක් විසින් ඔහුට වසර 75ක සිරදඬුවමක් නියම කර තිබේ. බොහෝ විදෙස් මාධ්‍ය විසින් මෙම දඬුවම යුක්තිය ඉටුවීමක් ලෙස දක්වා තිබුණත් එය යට තවත් සැඟවුණු කරුණු ගණනවක් තිබේ. මෙම දඬුවම ගැන අදහස් දක්වන Black Lives Matter ක්‍රියාකාරීන් පවසන්නේ මෙම පොලිස් නිලධාරියාට පමණක් දඬුවම් ලබාදීම ප්‍රමාණවත් නොවන බවයි. ඒ මොහොතේ ඩෙරික් ඩාවින් සමඟ සිටි අනික් පොලිස් නිලධාරීන්ට එරෙහිව කිසිදු චෝදනාවක් ගොනුකොට නැති බවද ඔවුන් පෙන්වා දෙයි.

එසේම ඩෙරික් ඩාවින්ට එරෙහිව ලබාදුන් තීන්දුව අමෙරිකා එක්සත් ජනපද අධිකරණ පද්ධතියේ සාධාරණත්වය පෙන්වන්නක් නොව එය ජනතාව සිදුකළ විරෝධතා, උද්ඝෝෂණ වැනි දේවල්වල ප්‍රතිපලයක් බව ගාඩියන් පුවත්පත් පවසයි.

ෆ්ලොයිඩ්ගේ ඝාතනයෙන් පසුව ඇති වූ විරෝධතා අමෙරිකා එක්සත් ජනපද හා මුළු ලෝකයේම ඇතිවූ විශාලතම විරෝධතා ව්‍යාපාරයක් ලෙස හැඳින්වේ. එය ලෝකයේ රටවල් 50 කට වැඩි ගණනක් පැවැත්වුණි. මෙම විරෝධතා නොතිබෙන්නට ඩෙරික් ඩාවින් වරදකරු කරනු ලැබුවද, මෙම චෝදනා මත නඩු විභාගය නොපැවැත්වෙනු ඇත. එසේ නොමැති නම් ජෝජ් ෆ්ලොයිඩ්ගේ මරණය නිකම්ම නිකම් පොලිස් අක්‍රමිකතාවයක් පමණක් වීමට ඉඩ තිබුණි. ඔහුගේ මරණය සෞඛ්‍යමය හේතුවක් නිසා සිදුවූ ලෙස හැඳින්වූ මුල් පොලිස් වාර්තාව මෙම ඝාතනය පිළිබඳ කිසිදු වීඩියෝ පටයක් නොතිබුනේ නම් තහවුරු වීමට ඉඩ තිබූ දෙයයි. එසේම Black Lives Matter විරෝධතා කරුවන් විසින් ඩෙරික් චාවින්ගේ අපකීර්තිමත් පොලිස් ඉතිහාසය අනාවරණය කරනු ලැබීය. එසේ නොමැතිව මෙම නඩු විභාගය ඉදිරියට ගෙනයාම තබා නඩු විභාගය වෙනුවෙන් නීතිඥයෙකු සොයා ගැනීම පවා අපහසු වෙනු ඇති බව Black Lives Matter ක්‍රියාකාරීහු පවසති.




# ආසියා සමුළුවට මියන්මාර් විරෝධතාකරුවන්ගේ විරෝධය

පසුගිය අප්‍රේල් 24වැනිදා පැවැත්වුණු ආසියාන් සමුළුවට සාපේක්ෂව මියන්මාරය තුළ නැවතත් විරෝධතා රැල්ලක් පැතිර යාම ඇරඹිණි. හමුදා ජුන්ටාවේ පාලනය අවසන් කිරීම සඳහා යයි පවසමින් ජුන්ටා ප්‍රධානියා සහ අග්නිදිග ආසියානු නායකයන් අතර ඇතිකරගත් ගිවිසුම මියන්මාර විරෝධතාකරුවන්ගේ දෝෂදර්ශනයට ලක්වී තිබේ. අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ (ආසියාන්) සාමාජිකයන් හමුදා පාලනයේ නායක ජෙනරාල් මින් අවුන්ග් හේලිං සමග ඉන්දුනීසියාවේ පැවති රැස්වීමෙන් දිනකට පසුවැඩ මියන්මාරයේ විශාල නගරවල විරෝධතා ඇවිළ ගොස් තිබේ. විරෝධතාකරුවන් පවසන්නේ නොසන්සුන්තාව අවසන් කිරීම සඳහා එකඟතාවකට පැමිණියද කාල නියමයක් ලබා නොදීම ගැටලුවක් බවයි.රොයිටර් පුවත් සේවය සමග අදහස් දැක්වූ විරෝධතාකරුවෙක් පවසා ඇත්තේ "එය ආසියාන් වේවා, එක්සත් ජාතීන් වේවා, ඔවුන් කතා කරනු ඇත්තේ 'සටන් නොකර සාකච්ඡා කර ගැටලු විසඳාගන්න' යනුවෙනි. නමුත් එය මියන්මාරයේ තත්වය පිළිබිඹු නොකරයි,"

ආසියාන් සභාපතිවරයා නිකුත් කළ නිවේදනයකට අනුව , ඉන්දුනීසියාවේ අගනුවර වන ජකර්තා නුවරදී කරුණු පහක් පිළිබඳව එකඟතාවකට පැමිණ ඇති අතර ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම, සියලු පාර්ශ්වයන් අතර සංවාදයක්, විශේෂ ආසියාන් නියෝජිතයකු පත්කර ගැනීම, ආධාර පිළිගැනීම සහ මියන්මාරයේ සංචාරය කිරීම සඳහා විශේෂ නියෝජිතයාට අවසර දීම යනු එම කරුණු පහයි. නමුත් මෙම කරුණු පහක සම්මුතියෙන් දේශපාලන සිරකරුවන් ගැන සඳහනක් කර නැත. සමුළුව පැවැත්වූ දින කිහිපයේ පවා විරෝධතාකරුවන්ට සහ සුළු ජාතික ජනකොටස් හමුදා පාලනය විසින් කෲර ලෙස මර්දනය කෙරිණි.

මේ අතර මියන්මාරයේ ආර්ථික තත්වය දිනෙන් දින බිඳ වැටෙමින් තිබේ. ලෝක බැංකුව අනතුරු අඟවා ඇති පරිදි මේ වසර තුළදී එරට ආර්ථිකය සියයට 10න් පහත වැටෙනු ඇත. එසේම මියන්මාර් ඇඟලුම් ක්ෂේත්‍රයේ ශ්‍රමිකයන් ලක්ෂ දෙකක් පමණ රැකියාවලින් දොට්ට දමා තිබේ. ඊට අමතරව වෙනත් ක්ෂේත්‍ර රැසක ශ්‍රමිකයන්ට රැකියා අහිමිවී තිබේ. ලෝක ආහාර වැඩසටහන සඳහන් කරන ආකාරයට මෙම රැකියා අහිමිවීම හේතුවෙන් ඉදිරි මාස කිහිපය තුළ මිලියන 3.4ට පමණ ආහාර අර්බුදයකට මුහුණ දීමට සිදුවෙනු ඇත.

ඊට අමතරව දහස් ගණන් ජනතාව හමුදා ජුන්ටාවේ මර්දනයෙන් බේරීම සඳහා ඉන්දියාවට සහ තායිලන්ත දේශසීමා වෙත සංක්‍රමණය වෙමින් සිටින බව නිදහස් මැතිවරණයක් සඳහා වූ ආසියානු ජාලය පෙන්වා දෙයි. එසේම දේශපාලන සිරකරුවන් සඳහා ආධාර සංගමය පෙන්වා දෙන පරිදි අප්‍රේල් 25වනදා වනවිට හමුදාව ජුන්ටාව විසින් 751ක් ඝාතනය කර තිබේ. 3431ක් සිරගතකර තිබේ. 20 දෙනෙකුට එරෙහිව මරණ දඬුවම පමුණුවා ඇති අතර 14 දෙනෙකුට වසර 3ක් සඳහා සිරදඬුවම් නියමකර තිබේ.

# වලංගු නොවූ ජීවිතවලට
# විලංගු දමන ක්ෂුද්‍ර මූල්‍ය



දුප්පතුන්ට සහයෝගීතාව දැක්වීමේ උපදේශාත්මක සමූහය (Consultative Group to Assist the Poor - CGAP) නිර්වචනය කර ඇති ලෙස 'ක්ෂුද්‍ර මූල්‍ය' යනු අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය පහසුකම් සැලසීමයි. විශේෂයෙන් ප්‍රමාණවත් සුරැකුම් ඉදිරිපත් කිරීමේ නොහැකියාව හේතුවෙන් විධිමත් බැංකු හරහා තම මූල්‍ය පහසුකම් සපුරා ගත නොහැකි දිළිඳු පුද්ගලයන් වෙත ණය පහසුකම්, ඉතුරුම් පහසුකම්, සහ අනෙකුත් මූල්‍ය පහසුකම් සැලසීම මේ මගින් සිදු කෙරේ. ක්ෂුද්‍ර මූල්‍ය සංකල්පය ලොවට පහළ වන්නේ දුප්පත්කම තුරන් කිරීමේ අදිටනින්ය. අනන්‍යා රෝයි සිය Power to Capital නම් ග්‍රන්ථයේ සඳහන් කරන ආකාරයට ක්ෂුද්‍ර මූල්‍ය සංවර්ධනයේ සෑම තලයකම පාහේ පැතිර පවතී. ඇයට අනුව නම් එය සර්ව රෝග නාශකයකි.

ක්ෂුද්‍ර මූල්‍ය සංකල්පය පළමු වරට ක්‍රියාත්මක කරන්නේ බංග්ලාදේශයේ මොහොමඩ් යූනුස් (Muhammad Yunus) විසිනි. ඒ ඔහුගේ ග්‍රාමීන් (Grameen) නම් වූ ක්ෂුද්‍ර මූල්‍ය සංකල්පය හරහාය. එහිදී ඔහුගේ ග්‍රාමීන් ක්‍රමවේදය යටතේ කණ්ඩායම් කාන්තාවන් වෙත සියයට බින්දුවේ සිට සියයට පහ දක්වා වූ පොලියක් යටතේ කිසියම් වූ ආයෝජනමය කටයුත්තක් සඳහා ණය ලබාදෙනු ලබයි.

1947 දී වොෂින්ටන් හිදී ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධව සමුළුවක් පවත්වනු ලැබූ අතර එහිදී මොහොමඩ් යූනුස් විසින් ඔහුගේ ක්ෂුද්‍ර මූල්‍ය සංකල්පයේ (ග්‍රාමීන්) අරමුණ පැහැදිලි කරනු ලැබීය. එහිදී ඔහු මෙම සංකල්පයේ අරමුණ ලෙස පැහැදිලි කරනු ලබන්නේ 'දුප්පත්කම කෞතුකාගාරයට යැවීම' යි. ඒත් අද වන විට ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය ගතහොත් ඒ අරමුණ ඉෂ්ට වී ඇති බවක් ප්‍රකාශ කිරීමට හැකියාවක් නැත. එසේම එම සමුළුවේදී ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධව ප්‍රධාන මාතෘකා හතරක් යටතේ කතාබහට ලක්විය. එම මාතෘකා හතර මෙසේය.

- දුප්පතුන්ගෙන් දුප්පතුන්ට ළඟාවීම.
- කාන්තාවන් බලගැන්වීම.
- ස්වයංපෝෂිත මූල්‍ය සමාගම් පිහිටුවීම.
- ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා ගන්නා පවුල්වල සාමාජිකයන්ට ධනාත්මක බලපෑමක් එල්ල කිරීම.

නමුත් මේ අරමුණු හතර අතුරින් ලංකාවේ ඉතා හොඳින් ඉටු වී ඇත්තේ තුන්වැනි කාරණය වන ස්වයංපෝෂිත මූල්‍ය සමාගම් පිහිටුවීමයි.

### ඉන්දියාවේ ආන්ද්‍රා අත්දැකීම

කෙසේ වෙතත් සමාජ සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය උදෙසා හඳුන්වා දුන් ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය මේ වන විට ලංකාවේ විනාශකාරී ලෙස ක්‍රියාත්මක වුවද ක්ෂුද්‍ර මූල්‍ය මෙලෙසම විනාශකාරී ලෙස ක්‍රියාත්මක වූ තවත් අවස්ථාවක් ඉන්දියාවෙන් ද හමු වේ. ඒ ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයෙනි. වික්‍රම අකුලා නමැති පුද්ගලයා විසින් ආරම්භ කරන ලද SKS නමැති සමාගම හරහා ඉතා විශාල වශයෙන් ලබා දුන් ක්ෂුද්‍ර මූල්‍ය ණය හරහා දැනට ශ්‍රී ලංකාවේ පවතින අර්බුදය වැනිම අර්බුදයක් මතු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මිනිස්සු ඉතා විශාල ප්‍රමාණයක් සියදිවි නසා ගත්හ. ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ මෙම සිදුවීම වාර්තා වූ විට ඉතා ඉක්මනින් ඉන්දියානු රජය විසින් මෙම SKS සමාගම රජය වෙත පවරා ගනු ලැබීය.

මෙම සිදුවීම පැහැදිලි කිරීම සඳහා හල්ඩර් සහ ස්ටිග්ට්ලස් (Haldar and Stiglitz) නමැති ආර්ථික විශ්ලේෂකයන් දෙදෙනා විසින් 2010 දී පරීක්ෂණයක් සිදුකර ඉන්දිය ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයේ පරිණාමික අවධි සම්බන්ධ අදහස් පළ කර ඇත. ඒවා නම්,

**කඩපිල් අවදිය** (The Boutique Moment) - මෙම අවධියේදී දුප්පත්කම නැති කිරීම අරමුණු කරගනිමින් ඉතා සුළු පරිමාණ වශයෙන් ණය ලබාදීම සිදුවිය. මෙම ණය ලබාදීම් සිදුවූයේ ගෘහ කර්මාන්තයන් සඳහාය. මෙම අවධියේ පැවති ඉතා විශේෂ ලක්ෂණයක් වන්නේ ණය ආපසු ගෙවීම් ඉතා ඉහළ ප්‍රතිශතයකින් වාර්තා වීමයි. එම ප්‍රතිශතය 98% ක් තරම්

> **දරිද්‍රතාවයේ පතුලේ ගිලී සිටි ජනතාවට සහන සලසන මුවාවෙන් මේවා කරළියට පැමිණියේය. එහෙත් සිදුවූයේ කුමක්ද? සහන වෙනුවට තව තවත් ජීවිත අහිමි කිරීමට මෙකී මූල්‍ය ආයතනවලට හැකිවිය. විශේෂයෙන් මූල්‍ය ප්‍රාග්ධනය ජන ජීවිත උඩු යටිකුරු කරන ආකාරය හොඳින් පෙනෙන්නට පටන් ගනු ලැබීය. නිශ්චිත වත්කමක් පෙන්වීමට නොහැකි දුප්පත් ජනතාවට ණය සහන ලබා දීමේ ක්‍රමයක් තවමත් රාජ්‍ය බැංකු හරහා ක්‍රියාත්මකව නොවීම නිසා ලංකාව ද ඇතුළුව දුප්පත් රටවල ජනතාවට මෙම ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල ගොදුරු බවට පත්වීම තවමත් නොවෙනස්ව සිදුවෙමින් තිබේ.**

ඉතා ඉහළ අගයක් විය. එසේම මෙම අවධියේදී ණය ලබාදීම් සිදුවූයේ කිසිදු නීත්‍යානුකූල ලියවිල්ලකින් තොරවයි. එනම් එය විශ්වාසය මත පදනම් වූ ණය ලබාදීමකි. මෙහිදී ණය නැවත ගෙවීමේ ප්‍රතිශතය ඉතාමත් ඉහළ වීම නිසා මෙම ක්‍රමය ඉතාම ලාභදායී ක්‍රමයක් ලෙස මූල්‍ය සමාගම් විසින් හඳුනාගනු ලබයි.

**ස්වර්ණමය අවධිය** (The Golden Age) - මෙම අවධියේ දී ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීම ඉතා විශාල වශයෙන් ඉහළ යනු ලැබීය. මෙම අවධියට 1980 පමණ සිට 2006 පමණ දක්වා කාලයට අයත් වේ. මෙම අවධියේ දී ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය රටවල් අසූ හතරක පමණ ප්‍රචලිත වන අතර මිලියන 100ක පමණ ජනතාවක් මෙම ණය ලබාගෙන ඇත.

**අර්බුදකාරී අවධිය** (The Age of Crisis) - සද්භාවයෙන් යැයි පවසමින් ආරම්භ කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය දැන් හුදු ව්‍යාපාරයක් පමණි. මේ නිසා ඉතා විශාල වශයෙන් ණය ලබා ගැනීම් හරහා මිනිසුන් දෙසීයකට වඩා වැඩි ගණනක් ආන්ද්‍රා ප්‍රදේශය තුළ සියදිවි නසාගෙන ඇත. මේ වන විට ලංකාව තුළද මෙම තත්වය වෙනසක් නොමැති බව අපට පෙනී යන්නේ දැනටමත් මෙම ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් විසි හතර ලක්ෂ තිස් අට දහසක් වන ස්ත්‍රීන් අතුරින් දෙසිය දෙනෙකුම සියදිවි නසාගත් බැවිනි. නමුත් පොලිස් වාර්තාවල හසු නොවූ මරණ මීට වඩා තිබිය හැක.

### ලංකාව සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරය

ලංකාව තුළ 1980 - 2006 අතර කාලය තුළ ක්ෂුද්‍ර මූල්‍ය ණය ඉතාම විශාල වශයෙන් ප්‍රචලිත වීම සිදු වේ. එසේම එම කාලය තුළ මේ සම්බන්ධව ඉතා විශාල පර්යේෂණ ප්‍රමාණයක් ද සිදුව ඇත. IPS සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථ නාමාවලියට අනුව 115ක් පමණ පර්යේෂණ ශ්‍රී ලංකාව තුළ සිදු වී ඇත. නමුත් ඉන් බහුතරය හඳුනාගනු ලබන්නේ මෙහි ධනාත්මක අර්ධය පමණි. නමුත් 2009න් පසු යුද්ධය අවසානයත් සමග මෙහි ඍණාත්මක අර්ධය මතුවීම ආරම්භ විය. එහෙත් එම ඍණාත්මක අර්ධය පිළිබඳව සිදුව ඇති පර්යේෂණ ගණන ඉතාම අල්පය.

මොහොමඩ් යූනුස් විසින් 1983දී ග්‍රාමීන් සංකල්පය හඳුන්වා දීමට පෙර ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය ක්‍රියාත්මක විය. වර්ෂ 1911 දී සමූපකාර ණය සමිති හරහා ක්ෂුද්‍ර මූල්‍ය සේවාව ලංකාවට හඳුන්වා දීම සිදු විය. ඉන්පසු 1942 වනවිට විට සමූපකාර ණය සමිති යොදාගනු ලබන්නේ දෙවන ලෝක යුද්ධයෙන් ඇති වූ ආහාර අර්බුදය සමග ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහාය. එහිදී කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා 1942 දී මෙම ණය සමිති යොදාගනු ලැබීය.

සැබැවින්ම දෙවන ලෝක යුද තත්වයෙන් පසු මතුවූ බරපතළ ආර්ථික අර්බුදය සමනය කිරීම සඳහා මෙන්ම, දරිද්‍රතාවයේ පතුලේ ගිලී සිටි ජනතාවට සහන සලසන මුවාවෙන් මේවා කරළියට පැමිණියේය. එහෙත් සිදුවූයේ කුමක්ද ? සහන වෙනුවට තව තවත් ජීවිත අහිමි කිරීමට මෙකී මූල්‍ය ආයතනවලට හැකිවිය. විශේෂයෙන් මූල්‍ය ප්‍රාග්ධනය ජන ජීවිත උඩු යටිකුරු කරන ආකාරය හොඳින් පෙනෙන්නට පටන් ගනු ලැබීය. නිශ්චිත වත්කමක් පෙන්වීමට නොහැකි දුප්පත් ජනතාවට ණය සහන ලබා දීමේ ක්‍රමයක් තවමත් රාජ්‍ය බැංකු හරහා ක්‍රියාත්මකව නොවීම නිසා ලංකාව ද ඇතුළුව දුප්පත් රටවල ජනතාවට මෙම ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල ගොදුරු බවට පත්වීම තවමත් නොවෙනස්ව සිදුවෙමින් තිබේ.

එය මේ වනවිට පිළිකාවක් මෙන් ලංකාවේ අන්ත පීඩාවට පත්ව සිටින ගොවි දිස්ත්‍රික්කවල හා යුද්ධයෙන් පසු තත්වය තුළ පීඩාවට පත්ව සිටින උතුරු නැගෙනහිර පීඩිත මිනිසුන් ගිලගනිමින් සිටී. මේ වනවිට ඔවුන්ට සියදිවි නසා ගැනීම හැර විකල්පයක් නොමැත. මානසික ආතතියට ගොදුරු වූවන්, ලිංගික හිංසනයට ගොදුරු වූවන් ,පවුල් සංස්ථාව බිඳ වැටීම් මෙන්ම දරුවන් අසරණ තත්වයට පත්වීම විසඳිය නොහැකි ගැටලුවක් ලෙස අප අබියස ඇත.

කෙසේවෙතත් මෙම මූල්‍ය සමාගම්වලට මැදිහත්වීමේදී ඉතා වැදගත් සිදුවීමක් වන්නේ 1992 දී මහබැංකුව තමන්ට පැවති ප්‍රධාන

☞ 11 පිටුවට

# ගොනා, පොල් පැළය සහ ගෝඨාභය ආණ්ඩුවේ නීති ප්‍රතිසංස්කරණ වෑයම



මේ වන විට, ගෝඨාභය-මහින්ද ආණ්ඩුව ඇතැම් නීති ප්‍රතිසංස්කරණ වෙනුවෙන් කැසපට ගසමින් සිටින බව පෙනෙන්නට තිබේ. මෙම නීති ප්‍රතිසංස්කරණ එක් පැත්තකින් මෙරට ආර්ථික සම්පත් වෙත නාභිගතවන අතර තවත් පැත්තකින් වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් සඳහා අදාළ වේ. ගෝඨාභය රාජපක්ෂ බලයට පත්වන අවස්ථාවේ දී මෙන්ම ඉන්පසුවත් 'එක රටක්-එක නීතියක්' වැනි සටන්පාඨ උලුප්පා දක්වනු ලැබිණි. එහෙත් කොළඹ වරාය නගරය තුළ රටේ පවතින නීති හෝ අවම වශයෙන් අධිකරණ ක්‍රමය පවත්වාගෙන යාමේ අදහසක් නැති බව 'වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත' සාක්ෂි දරයි. එය අභියෝගයට ලක් කරමින් පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය විට ආණ්ඩුව පවසන්නේ, අමාත්‍ය මණ්ඩලයේ සම්මත කිරීමෙන් පසු, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ, කෙටුම්පතට සංශෝධන කිහිපයක් තිබෙන බවය. මෙයින් කියැවෙන්නේ පනත් කෙටුම්පත තුළ ව්‍යවස්ථාවට පටහැනි කරුණු ඇති බව අභියෝගයට ලක්වීම නිසා එය වෙනස් කිරීමෙන් හෝ වරාය නගරයට අදාළ වෙනම නෛතික ක්‍රමය ආරක්ෂා කරගන්නට ආණ්ඩුවට ඇති බලවත් ඕනෑකමය. වෙනත් විදියකින් සිතිය හැක්කේ තමන් ගෙන ආ පනත් කෙටුම්පත අභියෝගයට ලක් නොවූවා නම්, එයම සම්මත කිරීම ආණ්ඩුවේ අරමුණ වූ බවය.

### ගෝඨාභය පාලනය නීති වෙනස් කරන අරමුණු

මේ ආකාරයට නීතිය සම්බන්ධ 'දේශපාලන ගේම්' අප දකින්නේ අද ඊයේ නොව, ඉතිහාසය පුරාම මෙවැනි නීති සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ විවිධ යටි අරමුණු සහ මතුපිට අරමුණු සමග බවය. ගෝඨාභය රාජපක්ෂ පාලනය පමණක් නොව ආසන්න කාලයේ ආණ්ඩු කිහිපයක් මෙරට නීති වෙනස් කිරීමට උත්සාහ දරා ඇත.

රාජ්‍ය පාලනයට අවශ්‍ය බලය කේන්ද්‍රගත කරමින් 20 වැනි සංශෝධනය සම්මත කරගත් හා පාර්ලිමේන්තුවේ 2/3 බලය සවිමත් කරගත් පසුබිමක නව නීති සම්මත කිරීමේ බාධාවක් ව්‍යවස්ථාමය වශයෙන් ආණ්ඩුවට නොමැත. එසේ වුවද කම්කරු පන්තියේ ප්‍රතිරෝධය සම්බන්ධ සාධකය ඔවුන් සලකා බලන්නේ නැත. අධික බලයක් කේන්ද්‍ර ගත කරගනිමින් නවලිබරල් ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් ජේ.ආර්. ජයවර්ධන පාලනය 70 දශකය අග භාගයේ සිට 80 දශකය පුරාම කම්කරුවන් මර්දනය කරමින් ඝාතනය කරමින් විදේශ ආයෝජන කැඳවා ගැනීමේ අරමුණින් කටයුතු කරන ලදී. බදුවලින් නිදහස් ආයෝජන කලාප සහ ඒවායේ වෘත්තීය සමිති අයිතිවාසිකම් කම්කරු නීති බල නොපවත්වන සූරාකෑමේ පාරාදීස පවත්වා ගෙන ගියද අපේක්ෂිත ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගන්නට අසමත් විය. මේ වනවිට වරාය නගරය ඇතුළු ආයෝජකයන් ආකර්ෂණය කරගැනීමේ ස්ථාන ආරම්භ කරමින් ජේ. ආර්. 1978 සිට කළ සෙල්ලමේ නව ආකාරයකට ගෝඨාභය-මහින්ද පාලනය අර අඳිමින් සිටී. එහිදී කම්කරු අයිතිවාසිකම් කප්පාදු කිරීමේ සිට සූරාකෑමේ පීඩාවෙන් පීඩිත ජනයා නැගී සිටින විට මර්දනය කිරීමේ අවශ්‍යතාව දක්වා නීති ප්‍රතිසංස්කරණ ගෙන එමින් තිබේ. මේ නිසා හුදු වැඩකරන ජනයාට අදාළ ක්ෂේත්‍රයේ පමණක් නොව, සමස්ත සමාජ අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ කප්පාදුවකට ආණ්ඩුව දත මදිමින් සිටින අතර දැනටමත් ඇතැම් නීති කෙටුම්පත් කර අවසන්ය.

### 'නව කම්කරු ධවල පත්‍රිකාව' හෙළිවීම

පසුගිය රනිල් - මෛත්‍රී ආණ්ඩුව සමයේ අනාවරණය වූ කරුණක් නම්, පවතින කම්කරු නීති සංශෝධනය කිරීමටත් දැනට ඒ හරහා සීමිත වශයෙන් හෝ ආරක්ෂා වී ඇති කම්කරු අයිතිවාසිකම් කප්පාදු කිරීමටත් පනත් කෙටුම්පතක් ගෙන එන්නට නියමිත බවය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත්වීම සහ එක්සත් ජනපද ආධාර වැඩසටහනක් හරහා මෙම 'කම්කරු ධවල පත්‍රිකාවෙන්' උත්සාහ දරන්නේ රාජ්‍ය, පෞද්ගලික හා වතු අංශයන්ට අදාළව පවතින නීති වෙනුවට අලුතින් තනි නීතියක් ස්ථාපිත කිරීමය.

2018 අගෝස්තු මාසයේ මේ සම්බන්ධ විරෝධතා ව්‍යාපාරයක් පවත්වමින් 'කම්කරු අරගල මධ්‍යස්ථානය' විසින් කරුණු ගණනාවක් හෙළි කරන ලදී. විනය පරීක්ෂණවලින් තොරව පෞද්ගලික අංශයේ සේවකයන් නෙරපීම සහ සේවක අර්ථසාධක අරමුදල පෞද්ගලික අංශයට පැවරීම සඳහා ආණ්ඩුව නීති සකස් කරමින් සිටින බවද එම විරෝධතාවයේදී හෙළි කෙරිණි. එපමණක් නොව, කම්කරු අයිතිවාසිකම් නොසලකා, සේවකයන් පිළිබඳ හිතුවක්කාරී තීරණ ගැනීමට සමාගම් හිමිකරුවන්ට බලතල ලබාදීමට ගෙන එන නීති සංශෝධන පරාජය කිරීමට වැඩකරන ජනතාව ඒකරාශී විය යුතු බව අවධාරණය කෙරිණි.

කම්කරුවන්ට අදාළව ක්‍රියාත්මක වන පනත් 53ක අඩංගු තෝරාගත් වගන්ති පමණක් ඇතුළත් කරමින් එක් පනතක් කෙටුම්පත්කර තිබිණි. 2016 ඔක්තෝබර් මාසයේදී රනිල්-මෛත්‍රී පාලනය යටතේ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය හරහා මෙම නීති කෙටුම්පත් කිරීමේදී අරමුදල් සම්පාදනය කෙරුණේ අමෙරිකා එක්සත් ජනපද ආධාර ඒජන්සියේ (USAID) අරමුදල් හා උපදේශකත්වය යටතේය. 1978 හඳුන්වා දුන් 'නවලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ' අපේක්ෂා කළ මට්ටමේ මහා පරිමාණ ආයෝජන කැඳවාගන්නට අසමත්වීම සමාලෝචනය කරමින් මේ දක්වා මෙරටට ස්ථාපිතකර ගන්නට නොහැකි වූ ප්‍රධාන පෙළේ කර්මාන්ත හා සේවා ඇරඹීම සඳහා ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ බව ප්‍රකාශිතය.

ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස 2017දී කෙටුම් පත්කර අවසන් වූ නව පනත් කෙටුම්පත, 'රැකියා සහ සේවා සැපයුම් කොන්ත්‍රාත් අයිතිවාසිකම් පනත', ලෙස කම්කරු අමාත්‍යාංශය හරහා කැබිනට් අනුමැතිය සඳහා යොමුකර තිබිණි. ආණ්ඩුව වෙනස් වීමෙන් පසුවද මෙම තත්වයේ වෙනසක් සිදුව නැත. ගෝඨාභය රාජපක්ෂ පාලනය විසින් රනිල්-මෛත්‍රී පාලනය යටතේ ඉදිරියට ගෙන ගිය මෙම නවනීති සම්පාදනයට අදාළ ඉදිරි පියවර ගැනීමේ අරමුණින් කටයුතු කරමින් සිටී.

### සංශෝධනය කෙරෙන නීති මෙන්න

ජනවාරි 21 වැනිදා 'දිවයින' පුවත්පත වාර්තා කළ අන්දමට, පෞද්ගලික හා ව්‍යවස්ථාපිත ආයතන සේවකයන් සඳහා බලපාන පනත් අටක් සංශෝධනය කිරීමටත්, අලුතින් විශේෂ විධිවිධාන පනත් දෙකක් ගෙන ඒමටත් කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා තීරණය කර ඇත.

මේ අතර සේවක අර්ථසාධක අරමුදල් පනත, කාර්මික ආරවුල් පනත, සේවකයන්ගේ අවම වේතන පනත, පඩි පාලක සභා ආඥාපනත, සාප්පු හා කාර්යාල පනත, අයවැය සහන දීමනා පනත, කර්මාන්තශාලා ආඥාපනත, කාන්තා හා ළමයින් සේවයේ යෙදවීමේ පනත යන පනත් සංශෝධනය කෙරෙන බව කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති පුවත්පතට පවසා තිබිණි. එසේම 'කම්කරුවන්ගේ සේවය අවසන් කිරීමේ විශේෂ විධිවිධාන පනත' හා 'කම්කරු පනත් ආඥාපනත යටතේ වන නඩු විභාග කඩිනම් කිරීමේ විශේෂ විධිවිධාන පනත' යනුවෙන් අලුතින් පනත් දෙකක් ගෙන එන බවත් කම්කරු කොමසාරිස්වරයා පවසා තිබිණි.

පවතින නීති යල්පැන ගොස් ඇති බවද ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි සේවකයන්ට වඩාත් ප්‍රතිලාභ හා සහන සැලසීමට මෙම පනත් සංශෝධනය කෙරෙනු ඇති බවද 'දිවයින' පුවත්පත එහිදී සටහන්කර තිබිණි.

සමස්තයක් ලෙස වසංගතයට පෙර සිටම වර්ධනය වෙමින් ආ ආර්ථික අර්බුදය ලෝක පරිමාණයෙන් අධිරාජ්‍යවාදී සමාගම්වලට ගැලපෙන ලෙස එක් එක් රාජ්‍ය තුළ නවලිබරල් ප්‍රතිසංස්කරණ ශීඝ්‍ර කරමින් ඉදිරියට ගෙන යාමේ බාධාවක් පැමිණ තිබේ. නව නීති ගෙන එමින් ලොව පුරා වැඩකරන ජනයා සූරාකෑමේ කාර්යක්ෂමතාව වැඩි කරමින් අතිරික්ත වටිනාකම් ඉපදවීමේ හා ඒ මගින් අධික ලාභ කඳුගැසීමේ ප්‍රවේගවත් ක්‍රියාදාමයක් පවතී. ගෝඨාභය රාජපක්ෂ පාලනය විසින් පැවති රනිල්-මෛත්‍රී පාලනයේදී ආරම්භ කළ නීති ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යාමේ වැදගත්කම සලකා බලමින් සිටින්නේ මේ නිසාය.

එවැනි පසුබිමක අනතුරුදායක නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධ කතිකාව ඉදිරියට ගෙන යාමත්, ඊට එරෙහිව විරෝධය පිණිස සංවිධානාත්මක බලයක් ගොඩනැගීමත් අවශ්‍ය වේ. ඒ අතරම ලිබරල් දේශපාලන මතයට මුවා වූ විරෝධයන් හරහා නැවත ධනපති ක්‍රමය ආරක්ෂා කරන වංචනික බලවේග ඉදිරියට එනු ඇත. නමුත් අවශ්‍ය වන්නේ සූරාකෑමේ අරමුණ මත නැවත නැවත නීති ප්‍රතිසංස්කරණ හරහා පණගසා එන මර්දනකාරී පාලන නීති පරාජය කරමින් සූරාකෑමේ ක්‍රමයට විකල්ප වැඩපිළිවෙළකි. නිසැකවම එවැනි ප්‍රයත්නයක් සඳහා, සමස්ත ජනසමාජයේ ආර්ථික බලය උසුලන, ආර්ථික ක්‍රියාවලිය හසුරුවන වැඩකරන ජනයාගේ සංවිධානාත්මක ව්‍යාපාරයක ශක්තිය අත්‍යවශ්‍ය වේ. සූරාකෑම අහෝසි කිරීමේ අරමුණ වෙනුවෙන් සමාජයක් පෙළගැස්වීමේදී පුද්ගල මට්ටමේ හෝ සංවිධාන මට්ටමේ හුදකලා සටන් වෙනුවට සමස්ත සමාජයක් දායක කරගැනීමේ අරමුණින් බලසම්පන්න ජනතා ව්‍යාපාරයක් බිහි කිරීම අවශ්‍ය වේ.

# 'පොල්තෙල්වල වස!' අපි මොකද කරන්නේ?



මාර්තු 4 වැනිදා ලංකාවට ගෙන්වූ පොල්තෙල් තොග යක ඉතාම විෂ සහිත ඇෆ්ලටොක්සින් නම් රසායනිකය පැවතීමත් සමග ආහාරවල වසවිස සම්බන්ධයෙන් නැවත සමාජ කතිකාවක් ඇතිවී තිබෙනවා. ආහාර අපට පෝෂණය සපයනවාට අමතරව ඒවා අපේ ලෙඩරෝගවලට ආරක්ෂණය දෙන ඖෂධ ලෙසත් ක්‍රියා කරනවා. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සලකන හිපොක්‍රටිස් පවසා ඇත්තේ 'Food be thy medicine and let medicine be thy food', එනම් ආහාර ඔබේ ඖෂධ විය යුතු අතර ඔබ ගන්නා ඖෂධ ආහාර විය යුතුයි කියලා. ලංකාවෙත් සාම්ප්‍රදායික ආහාර සංස්කෘතිය වගේම සාම්ප්‍රදායික අත්බෙහෙත් වෙදකමත් මේ මූලධර්මය රැක්කා. නිදසුනක් විදියට ලංකාවේ ජනතාව ආහාර සැකසීමේදී කුළුබඩු ලෙස යොදා ගන්නා සූදුරු, මහදුරු, ගම්මිරිස්, මිරිස්, කරපිංචා, කහ, කුරුඳු, ගොරකා, සියඹලා, අබ, කොත්තමල්ලි, එනසාල්, කරාබුනැටි ආදී සියල්ල ඖෂධීය ගුණ අඩංගු දේවල්. විවිධ සුළු අසනීප සඳහා ලංකාවේ ගැමියන් ලබා ගන්නා අත්බෙහෙත් සියල්ලම පාහේ ආහාර ලෙස ගන්නා ශාක හෝ සත්ව කොටස් වීමත් තවත් නිදසුනක්. නමුත් ධනවාදය තුළදී මේ තත්වය වෙනස් වී අප ගන්නා ආහාර වස බවට පත්වී වස යනු අපේ ආහාර ලෙස අර්ථකථනය වන තත්වයක් ඇතිවී තිබෙනවා. ආහාර කර්මාන්තය ලාභ අරමුණු කරගත් එකක් වීමත් සමග ජීවිත ආරක්ෂා කර ගැනීමට අප ගන්නා ආහාර හරහා අපේ ජීවිත විනාශ වන තත්වයක් ඇතිවී තිබෙනවා.ඒ සම්බන්ධයෙන් මුලින්ම අවධානය යොමු වුණේ පොල්තෙල් සිදුවීමත් සමග නිසා අපි මුලින්ම එහි ඇත්ත නැත්ත විමසමු.

අලි බ්‍රදර්ස් පුද්ගලික සමාගම, එදිරිසිංහ එඩිබල් ඔයිල්ස් හා කටාන රිෆයිනරීස් යන සමාගම් ආනයනය කළ පිරිපහදු නොකළ තෙල් තොගවල "ඇෆ්ලටොක්සින්"නමැති ප්‍රබල පිළිකා කාරකය ඉහළ ප්‍රතිශතයකින් අඩංගු බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ ඒකකය මුලින්ම අනාවරණය කළා. සාමාන්‍ය තත්වය යටතේ පිරිපහදු නොකළ පොල්තෙල් කිලෝවක ඇෆ්ලටොක්සීන් මයික්‍රෝ ග්‍රෑම් 10 ක් පමණ තිබිය යුතු වේ යැයි සම්මුතියක් තිබෙනවා. එහෙත් ආනයනය කර තිබූ පරිපහදු නොකළ පොල්තෙල් කිලෝවක ඇෆ්ලටොක්සීන් මයික්‍රෝ ග්‍රෑම් 30කට වැඩියෙන් තිබී ඇති නිසා එම ප්‍රමාණය සාමාන්‍ය ප්‍රමාණය මෙන් තුන් ගුණයක ඉහළ යෑමක්. එය ශරීරයට අහිතකරයි. නමුත් ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය මුලින් එම පොල්තෙල් සාම්පලවල අහිතකර තරමින් විෂ රසායනික අඩංගු නොවන බව රේගුවට දැනුම් දී තිබුණා. ඒ අනුව අදාළ සමාගම් පොල්තෙල් කිලෝග්‍රෑම් 183,000 ක් අඩංගු බහාලුම් 13 ක් රේගුවෙන් නිදහස් කරගෙන ඇති බව පසුව වාර්තා වුණා. පිළිකා කාරක රසායනිකයක් සහිත පොල්තෙල් වෙළඳපොළට නිකුත්වී ඇති බවට පුවත් ප්‍රචාරය වුණේ මේ සමග.

ඉන් අනතුරුව විශාල ආන්දෝලනයක් ඇතිවුණේ ප්‍රමිති කාර්යාංශයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරිය සිද්ධිකා සේනාරත්න පෞද්ගලික රූපවාහිනී නාළිකාවක් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවකදී පවසන ලද කරුණු නිසා. එහිදී ඇය කරුණු කිහිපයක් කීවා. එකක් ප්‍රමිති කාර්යාංශය විසින් පරීක්ෂා කරන්නේ SLS සහතිකය ලබාදී ඇති භාණ්ඩ වර්ග 117ක් පමණක් බව. එනිසා අනෙකුත් ආහාරවල වසවිස තිබේදැයි ඔවුන් අතින් පරීක්ෂා වෙන්නේවත් නෑ. අනෙක ප්‍රමිති කාර්යාංශය පරීක්ෂා කරන ආහාරවලත් මීට පෙර සිට විෂ රසායන තිබුණු බව. ඒ වගේම ඒ වසවිස සහිත ආහාර හෙළිදරව් කළ නොහැකි බවත්, හෙළිදරව් කළොත් සමාගම් ජාලය ඇතුළු මුළු පද්ධතියම බිඳ වැටෙන බවත් ඇය කීවා. ඒ නිසා ටික කලක් වස කන ලෙස ඇය පැවසීම නිසා විශාල ආන්දෝලනයක් ඇති වුණා. නමුත් ඇය පැවසූ දේවල ඇත්තක් තිබෙනවා. පොල්තෙල්වල පමණක් නොව අනෙක් හැම ආහාරයකම වස තිබෙනවා. සහල්වල ආසනික් සහ කැඩ්මියම්, එළවළුවල කෘමිනාශක, පලතුරුවල කල් තබා ගැනීමේ රසායනික, කිරිපිටිවල මෙලමයින් සහ ඩී.සී.ඩී., දියර කිරිවල ඇෆ්ලටොක්සින්, මාළුවල ෆෝමලින්, කුකුළු මස්වල අහිතකර හෝමෝන්, මේ ආකාරයේ ලැයිස්තුවක්ම කියන්න පුළුවන්.

අනෙක පොල්තෙල්වල ඇෆ්ලටොක්සින් තිබීම අලුතින් සිදුවූ දෙයක් නෙවෙයි. අපි නිදසුනක් ගනිමු. පේරාදෙණිය සරසවියේ පර්යේෂකයින් කණ්ඩායමක් වන නුවන් බී. කරුණාරත්න, චන්දන ජේ. ප්‍රනාන්දු, ඩී.එම්.එස්. මුණසිංහ, රුචිකා ප්‍රනාන්දු යන අය විසින් කරන ලද පර්යේෂණයකට අනුව ඔවුන් වෙළඳපොළෙන් ලබාගත් පොල්තෙල් සාම්පල 32 කින් 12 කම (වෙළඳ නාම සහිත 7 සහ රහිත 5) AFB1 පිළිවෙළින්, 2.25-72.70 µg/kg සහ 1.76-60.92 µg/kg, ප්‍රමාණවලින් තිබූ බව සඳහන්. යුරෝපා ප්‍රමිතීන් අනුව ආහාරවල අඩංගු විය හැකි සම්පූර්ණ ඇෆ්ලටොක්සින් ප්‍රමාණය 4 µg/kg විය යුතු අතර AFB1 තිබිය හැක්කේ 2 µg/kg පමණයි. මේ සියලුම පොල්තෙල් වර්ග නිෂ්පාදනය සඳහා භාවිත කර තිබුණේ කොප්පරා වීම ද විශේෂත්වයක්. ඔවුන් කළ පර්යේෂණය අනුව වෙනත් එළවලු තෙල් වර්ගවල ඇෆ්ලටොක්සින් තිබී ඇත්තේ 0.8 ද්‍යට/නට ප්‍රමාණයක්. මේ පර්යේෂණය එළිදැක්වී ඇත්තේ 2019 පෙබරවාරි මස. නමුත් ඒ වාර්තා මාධ්‍යවල ප්‍රකාසයට පත් කෙරුණේ නෑ. අනෙක් අතට මීට පෙරත් විෂ සහිත බව තහවුරු කළ අහාර ද්‍රව්‍ය රේගුවෙන් නිදහස් කර තිබෙනවා. අප්‍රේල් 3 වැනිදා පාරිභෝගික ආරක්ෂක රාජ්‍ය ඇමති ලසන්ත අලගියවන්න මේ වන විට පවතින නීතිය අනුව සාම්පල එක්කර වාර්තාව පැමිණෙනතෙක් රේගුවෙන් භාණ්ඩ තාවකාලිකව මුදාහරින බව බී.බී.සී.යට පවසා තිබුණා. ඒ කියන්නේ මීට පෙරත් එවැනි අහිතකර ආහාර සමාජගත වී තිබෙනවා. එමෙන්ම අවසානයේ රේගුව කළේ අශ්වයාට පිටවීමට ඉඩහැර ඉස්තාලය වසා දැමීම. විෂ පොල්තෙල්වලට වෙළෙඳපොළට පිටවීමට ඉඩදී පසුව රට පුරා ඇති වෙළෙඳසල්වලින් පොල්තෙල් නියැදි 125ක් මේ වන විට එකතුකර පරික්ෂා කිරීමට ඔවුන් කටයුතු කළා. මිනිස් ශරීරයට අහිතකර ඇෆ්ලටොක්සින් පොල්තෙල්වල අඩංගු බව ඒ දෙවන පරීක්ෂණයෙනුත් තහවුරු වුණා. මීට කලින් සිදුවී තිබෙන්නේත් මෙයමයි.

මේ ආකාරයට පොල්තෙල්වල වස අඩංගු වෙන්නේ කොහොමද? ඒ සඳහා අපට විද්‍යාත්මක තොරතුරු ටිකක් කතා කරන්න වෙනවා. ඇෆ්ලටොක්සින් කියන්නෙ පිළිකාකාරක රසායන ද්‍රව්‍යයක්. ලෝකයේ ඇෆ්ලටොක්සින් වර්ග 14 ක් පමණ තිබුණත් මිනිසාට සහ සතුන්ට හානිදායක වන්නේ වර්ග 4 ක් පමණයි. මෙය ප්‍රධාන වශයෙන්ම නිපදවන්නේ *Aspergillus flavus* සහ *Aspergillus parasiticus* නම් දිලීර (පුස් වර්ගය) මගින්. ඇෆ්ලටොක්සින් කියන්නේ හයිඩ්‍රොකාබන වළලු පහක් එකිනෙක බැඳී සෑදුන රසායනිකයක්. Aflatoxin B1, Aflatoxin B2, Aflatoxin G1, Aflatoxin G2, (AFB1,AFB2, AFG1, AFG2) කියලා වර්ග හතරක් තියෙනවා. මේවා නම් කරලා තියෙන්නෙ ෆ්ලොරසන්ට් ආලෝකය හමුවේ මේ රසායන ද්‍රව්‍ය හඳුනාගත හැකි ආකාරයට B1,ඊ2 නිල් පාටයි, G1,G2, කොළ පාටයි. Aspergillus parasiticus විසින් B G දෙවර්ගයම නිෂ්පාදනය කරන අතර Aspergillus කේඩම් නිෂ්පාදනය කරන්නේ ඊ වර්ගය පමණයි. මේ දිලීර වර්ග හැදෙන්නේ කෘෂිකාර්මික නිෂ්පාදන මත. විශේෂයෙන්ම ඒවා තෙත්, උණුසුම් ස්ථානයක වැඩි කාලයක් ගබඩා කිරීම නිසා මෙම දිලීර වර්ධනය වෙනවා. රටකජු, මඤ්ඤොක්කා, ඉරිඟු, මිරිස්, හාල්/වී, සෝයා, තිරිඟුපිටි, විවිධාකාර ඇට වර්ග සහ කුළුබඩු වර්ග මත වර්ධනය වනවා. ඒ නිසා තමයි කියන්නේ මේ දේවල් හොඳින් අව්වේ වියළා ගබඩා කරන්න කියලා. පොල්තෙල්වලට ඇෆ්ලටොක්සින් එකතු වෙන්නේ ඒවා නිෂ්පාදනයට භාවිත වන කොප්පරා පුස් කෑම නිසා. මේ ආකාරයට පුස්කෑ කොප්පරා භාවිත වීම පොල්තෙල් නිෂ්පාදනයේ මහා පරිමාණ නිෂ්පාදන ක්‍රමවේද සහ සමාගම්වල ලාභ අරමුණු සමග ගැටගැසී තිබෙනවා. සාමාන්‍යයෙන් සාම්ප්‍රදායික ලෙස නිවෙස්වල සිදු කෙරුණු සුළු පරිමාණ පොල්තෙල් සිඳ ගැනීමේ ක්‍රියාවලියේදී වසවිස එකතු වෙන්නේ නෑ. මේ ප්‍රශ්නය එන්නේ මහා පරිමාණ සමාගම්වල පොල්තෙල් නිෂ්පාදනයේදී. ඒවායේ පොල්තෙල් සිඳීම සඳහා භාවිත කරන කොප්පරා පුස් කමින් වැඩි කාලයක් තබා ගන්නවා. නිෂ්පාදනයට හදිසි නිසා ඒවා නිසි පරිදි වේළීම සිදු වෙන්නේ නෑ. ඒ නිසා ඒවාට ඇෆ්ලටොක්සින් එකතුවීමේ සම්භාවිතාව වැඩියි.

නමුත් මහා පරිමාණ නිෂ්පාදනයේදීත් ඒ අහිතකර රසායන ඉවත් කළ හැකියි. වාණිජ ලෙස කර්මාන්තශාලාවල පොල්තෙල් සකස් කිරීමේදී වෙළඳපොළට යවන්න කලින් ඒවා පිරිපහදු කළ යුතුයි. ඊට අමතරව රසායනික ක්‍රමවේදයකට පාට සහ මුඩු සුවඳ යනාදියත් ඉවත් කෙරෙනවා. මේ පිරිපහදු කිරීම් හරහා ඇෆ්ලටොක්සින් පවා ඉවත් කෙරෙනවා. වෙළඳපොළේ තිබෙන තෙල් බෝතල්වල සඳහන් කරලා තියෙනවනේ ආර්.බී.ඩී. (RBD) කියන අකුරු තුන. ඒ කියන්නේ පිරිසිදු කළ, විරංජනය කළ නොහොත් පාට ඉවත් කළ හා මුඩුගඳ නැසූ(Refined, Bleached, Deodorized) කියන අර්ථය.

නමුත් ඒ ක්‍රියාවලියට වියදමක් යන නිසා, එමගින් ලාභ අඩුවන නිසා බොහෝ සමාගම්වල මෙය නිසි පරිදි සිදු කෙරෙන්නේ නෑ. ඒ නිසා ධනවාදය පවතින තුරු අපට කන්න වෙන්නේ වස පොල්තෙල්. ඒ අතින් සිද්ධිකා කියූ දේ හරි. ආහාරවල වස හෙළිදරව් කළොත් සමාගම් ඇතුළු මේ පද්ධතියම බිඳ වැටෙනවා.

# ජාත්‍යන්තර කම්කරු දින පණිවුඩය - 2021
# පෙරටුගාමී සමාජවාදී පක්ෂය

මෙවර ද ජාත්‍යන්තර කම්කරු දිනය එළඹී ඇත්තේ කොවිඩ් වසංගතය ලෝක පරිමාණයෙන් අලුත් වටයකින් විනාශකාරීව ඉස්මතු වන තත්වයක් යටතේය. පසුගිය වසරේද ලොව පුරා වැඩකරන ජනතාවට සුපුරුදු පරිදි පෙළපාළි සහ රැස්වීම් හරහා ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීමට නොහැකි වූයේ කොවිඩ් වසංගතය විසින් විශාල අවදානමක් උද්ගත කර තිබුණු බැවිනි. මෙවර කොවිඩ් තුන්වන රැල්ලක් පිළිබඳ අනාවැකි කියමින් ජාත්‍යන්තර කම්කරු දිනයට අදාළ කිසිදු වැඩසටහනක් පැවැත්වීම තහනම් කෙරෙන බව ලංකාවේ ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත්කර තිබේ. එය මුලින් සියලු දේශපාලන පක්ෂ සමග පැවති සාකච්ඡාවකදී එළඹුණු එකඟතාවක් බව පැවසුවද ඒ සඳහා එකඟ වී ඇත්තේ ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් වන දක්ෂිණාංශික පක්ෂ කිහිපයක් පමණක් බවද, වාමාංශික පක්ෂ සහ වෘත්තීය සමිති ඒ සඳහා එකඟතාවක් නැති බවද ප්‍රකාශයට පත්විය. පෙරටුගාමී සමාජවාදී පක්ෂය ජාත්‍යන්තර කම්කරු දින වැඩසටහන් තහනම් කිරීමේ අත්තනෝමතික උත්සාහය දැඩිව හෙළා දකින අතර කම්කරු දිනය සම්බන්ධයෙන් තීරණය ගත යුතුව තිබෙන්නේ වැඩකරන ජනතාව මිස පාලක පන්තිය නොවන බව තරයේ ප්‍රකාශ කර සිටී.

පසුගිය වසරේ නිරෝධායන ඇඳිරි නීතිය පැවතුණු තත්වයක් හමුවේ පෙරටුගාමී සමාජවාදී පක්ෂය මාර්ගගත ක්‍රමවේද හරහා ජාත්‍යන්තර කම්කරු දිනය පවත්වද්දී තේමාව ලෙස තෝරා ගත්තේ 'ව්‍යසනයේ බර ජනතාව මත පටවන, ධන කුවේරයන්ගේ ලාභ කඳු රකින, ධනවාදයට එරෙහිව සමාජවාදය' යන තේමාවයි. ගෙවුණු වසරේ සියලු අත්දැකීම් පෙන්වා දෙන්නේ ගෝලීය වසංගතය හමුවේ ජාත්‍යන්තර පරිමාණයෙන් ක්‍රියාත්මක කළ යුතුව තිබූ දේශපාලනය එය බවය. වසංගතය හමුවේත් ධනපතියන්ගේ සහ ඒකාධිකාර සමාගම්වල ලාභ කඳු වලින් සොච්චමක්වත් සමාජයීය ආරක්ෂාව සඳහා සොලවනු ලැබුවේ නැති අතර ඊට ප්‍රතිපක්ෂව වසංගතය හමුවේ ඔවුන්ගේ ලාභ රේට්ටු ඉහළ ගියේය. වසංගතයේ සමස්ත බර වැඩකරන ජනතාව මත පටවනු ලැබීය.

වසංගතය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ 2020 වර්ෂය තුළ වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් විශාල කඩා වැටීමකට ලක් වුවද බිලියනපති ධනපතියන්ගේ ඩොලර් ට්‍රිලියන 8ක් වූ ධනයට අලුතින් ඩොලර් ට්‍රිලියන 5.1ක් එකතු විය. වසංගතයේ බරපතළම බලපෑමට හසුව දිනපතා දහස් ගණනින් ජනතාව රෝගී වන හා මියයන අසල්වැසි ඉන්දියාවේ ඉහළම ධනපතියන් තිදෙනාගේ ධනය එම වසර තුළ ඩොලර් බිලියන 100කින් ඉහළ ගියේය. ලංකාවට අදාළවද මේ තත්වය එලෙසමය. සමාගම්වල ලාභ රේට්ටු ඉහළ ගිය පසුගිය වසරේ පෞද්ගලික අංශයේ කම්කරුවන් ලක්ෂ 6ක පමණ ප්‍රමාණයකට ජීවනෝපායන් අහිමිවිය. අසංවිධිත ශ්‍රම ක්ෂේත්‍රයේ සේවයේ නියුතු ජනතාවගේ ආදායම් භයානක ලෙස පහත වැටිණි. රජය සහන ලබා දුන්නේද ධනපති සමාගම්වලට බව තහවුරු වන්නේ 2021 අයවැය හරහා කොටස් වෙළඳපොළ ලියාපදිංචි සමාගම්වලට 50%ක බදු සහනයක් ලබාදුන් අතර ජනතාවට කිසිදු ආකාරයක බදු සහනයක් ලබා දුන්නේ නැත. අත්‍යවශ්‍ය ආහාර සහ ඖෂධවලට පවා අලුතින් බදු පැනවූ අතර ලෝක වෙළඳපොළේ ඉන්ධන මිල පහත වැටී තිබුණද එම සහනය ජනතාවට හිමි නොවීය. පසුගිය වසරේ කාර්තු හතරේදීම උද්ධමනය අඛණ්ඩව 6%ක පමණ අනුපාතයකින් වැඩි විය. 2021 මාර්තු මාසයේ උද්ධමනය 5.1ක් විය. වසංගතයේ වාසිය ධනපතියන් විසින් උකහා ගනිමින් සිටින අතර එහි වන්දිය සම්පූර්ණයෙන්ම පාහේ ගෙවීමට සිදුව ඇත්තේ වැඩකරන පන්තියටය.

මෙතරම් විනාශකාරී වසංගතයක් ලොව පුරා පැතිරෙද්දීත් 2020 වසරේ ලෝකයේ මිලිටරි වියදම් ඩොලර් ට්‍රිලියන 1.83 දක්වා ඉහළ ගියේය. ලෝක දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මිලිටරි වියදම් 2019දී 1.85% සිට 2020දී 2.08% දක්වා ඉහළ ගියේ වසංගතයෙන් ජනජීවිත බේරා ගැනීමට වඩා වැඩි බරක් ප්‍රාග්ධන අභිලාෂයන්ට, අධිරාජ්‍යවාදී යුද්ධයට හා මර්දනයට තබා ඇති බව ඔප්පු කරමිනි. ලංකාවේද 2021 අයවැය මිලිටරියට වැඩි ප්‍රමුඛතාව ලබා දෙමින් ආරක්ෂක අමාත්‍යාංශයට රුපියල් බිලියන 355ක් හා පොලිසියට රුපියල් බිලියන 85ක් ලෙස පොදුවේ මර්දන යාන්ත්‍රණ සඳහා රුපියල් බිලියන 440ක් වෙන් කළේ 2019දී එම අගය වූ රුපියල් බිලියන 393 ඉක්මවා යමිනි. නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් මේ වසංගත තත්වය හමුවේ පවා මහජන බදු මුදලින් වෙන් කරනු ලැබුවේ රුපියල් බිලියන 159ක් පමණි. අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශවලට වෙන්කළ මුදලද එකතු කළ විට සෞඛ්‍ය සඳහා වෙන් කර ඇත්තේ රුපියල් බිලියන 221කි. එය මාර්ග සංවර්ධනය සඳහා වෙන් කරනු ලැබූ රුපියල් බිලියන 330ටත් වඩා අඩු මුදලකි. කොවිඩ් දෙවන රැල්ල 2020 සැප්තැම්බරයේ ආරම්භ වෙද්දී වෛරස ව්‍යාප්තිය වැළැක්වීම සඳහා අවම පියවර හෝ නොගත් ආණ්ඩුව මෙවර සිංහල-දෙමළ අලුත් අවුරුදු සමයේ සෞඛ්‍ය රෙගුලාසි සියල්ල ලිහිල් කරමින් තුන්වන රැල්ලක් සඳහා මාර්ගය විවර කළේය. අප්‍රේල් මස අවසානයේ රෝගීන් ප්‍රමාණය ඉහළ යද්දී වැඩකරන ජනතාව සේවයට වාර්තා කිරීමේ සහ සිසුන් පාසල් යාමේ අවදානම සඳහා කිසිදු පියවරක් නොගෙන සිය දේශපාලන න්‍යායපත්‍රය වෙනුවෙන් කම්කරු දිනය තහනම් කිරීමේ හා විශ්ව විද්‍යාල වසා දැමීමේ ආදී පියවර අනුගමනය කරමින් සිටී. ධනවාදය තුළ ගෝලීය වසංගත පවා භාවිත වන්නේ ධනපතියන්ට ලාභ කඳු ගොඩගසා ගැනීම සඳහාත් පාලකයන්ට මර්දනය කැඳවීමේ නිමිත්තක් ලෙසත් පමණක් බව අපගේ සමකාලීන අත්දැකීම් තහවුරු කරමින් සිටී.

පවතින ධනේශ්වර ආර්ථික අර්බුදයේ බර ජනතාව මත පටවමින් එය ධනපතියන්ට ලාභ උල්පතක් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක පාලකයන් සිටී. ලංකාවේ ආර්ථික අර්බුදය කොවිඩ් වසංගතය හේතුවෙන් ඇති වූවක් බව තහවුරු කිරීමට ආණ්ඩුව උත්සාහ කළද වසංගතය පැමිණීමට පෙර 2020 පළමු කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සෘණ අගයක් (-4.6) වාර්තා කළේ එය ධනවාදයේ නෛසර්ගික අර්බුදයේ කොටසක් බව ඔප්පු කරමිනි. එම අර්බුදය හමුවේ පාලකයන් විකල්ප ලෙස භාවිත කළේ ආනයන සීමා හරහා සහ භාණ්ඩ හා සේවා මත බදු වැඩි කිරීම හරහා ජනතාව මත බර පැටවීමත්, මුදල් අලුතින් මුද්‍රණය කිරීමත්, විශාල ලෙස ණය ගැනීමත්, ගෝලීය ප්‍රාග්ධනයට ලංකාව විවෘත කිරීම සඳහා මෙතෙක් පැවති කම්කරු නීති- පරිසර නීති - ඉඩම් නීති- මූල්‍ය නීති ආදියේ ප්‍රමිති කප්පාදුවත් යන උපක්‍රම පමණි. එම්.සී.සී. ගිවිසුම අත්සන් කිරීම, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකිණීම ආදී ක්‍රියාමාර්ග සහ මහා පරිමාණයෙන් කිරීමට උත්සාහ කළ පරිසර සංහාරය සහ ඉඩම් මංකොල්ලය ජනතා අරගල මගින් යම් පරිමාණයකට පසුබැස්විය හැකි වුවත් වරාය නගර කොමිෂන් පනත, සමූපකාර සංශෝධන පනත, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල පනත, ඉඩම් ආඥා පනතේ සංශෝධන ආදිය විසින් තහවුරු කරන්නේ පාලකයන් එම විනාශකාරී මාවතේ දිගටම ගමන් කරමින් ගෝලීය ප්‍රාග්ධනයේ ආර්ථික අභිලාෂයන් සහ ලෝක බලවතුන්ගේ -කලාපීය බලවතුන්ගේ- අධිරාජ්‍යවාදීන්ගේ බල පොරයේ දේශපාලන උපායමාර්ගයන් වෙනුවෙන් ජනතා අභිලාෂයන් පාවා දෙමින් සිටින බවයි.

මේ මොහොතේ ලංකාව පමණක් නොව සමස්ත ලෝකයම මුහුණ දී සිටින ආර්ථික-දේශපාලන-සමාජයීය-සංස්කෘතික-පාරිසරික අර්බුදයට සහ වසංගත අවදානමට මුහුණ දිය හැක්කේ ගෝලීය පරිමාණයෙන් වැඩකරන ජනතාවගේ බලයක් ගොඩනැගීමෙන් සහ ධනවාදය පරාජය කර සමාජවාදය ස්ථාපිත කිරීමෙන් පමණක් බව අවිවාදිතව තහවුරු වී තිබේ. කවර බාධා මධ්‍යයේ වුව මෙවර ජාත්‍යන්තර කම්කරු දිනය වෙනුවෙන් බලවේග පෙළ ගැස්වීමේ අත්‍යවශ්‍යතාව පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් අවධාරණය කරන්නේ එබැවිනි. 'අධිරාජ්‍යවාදී උගුලෙන්, නව ලිබරල් කොල්ලයෙන් ජනතාව ගලවන - වැඩකරන ජනතා බලයක්' තේමාව යටතේ ඒකරාශී වන මෙන් 2021 ජාත්‍යන්තර කම්කරු දිනයේදී ලංකාවේ වැඩකරන ජනතාව, පීඩිත ජනකොටස්, ප්‍රගතිශීලීන් ඇතුළු සියලු දෙනාගෙන් ඉල්ලා සිටිමු.

**මධ්‍යම කාරක සභාව**
**පෙරටුගාමී සමාජවාදී පක්ෂය**
2021 මැයි 01

# වලංගු නොවූ ජීවිතවලට විලංගු දමන...

08 පිටුවෙන්

කාර්යභාරයන් දෙකක් වූ සංවර්ධන කාර්භාරය සහ අධීක්ෂණ කාර්යභාරය අතුරින් සංවර්ධන කාර්යභාරයෙන් ඉවත් වීමයි. මේ වන විට අධීක්ෂණ කාර්ය භාරය ඇත්තේ ද නමට පමණය. ආසියානු සංවර්ධන බැංකුව විසින් 2000 වසරේදී සිදු කරනු ලැබූ සමීක්ෂණයකට අනුව ඔවුන් හඳුනාගෙන ඇත්තේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වාණිජකරණය වීම 2000 වර්ෂයේදී පමණ ආරම්භ වන බවයි.

2000 වසරේදී ලබාදී තිබූ ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රමාණය මිලියන දහඅටදහස් දෙසිය දහතුනකි. වසර 2018 වන විට එය බිලියන අනූ හතරදහස් හාරසිය පහළොව දක්වා ඉහළ ගොස් ඇත. එය 400%ක වර්ධනයකි. එනම් සාමාන්‍යයෙන් එක් වර්ෂයක් තුළ 23% කින් කර්මාන්තය වර්ධනය වී ඇත. එහෙත් මහ බැංකුව විසින් මෙම ණය ලබාදීම් සඳහා කිසිදු නියාමනයක් සිදුකර නැත. සාමාන්‍යයෙන් වාණිජ බැංකුවකින් ණය ලබාදීමක් සිදුවන විට ඒ සඳහා කිසියම් තක්සේරු කරන ක්‍රමවේදයක් පවතී. එය හරහා ණය ලබාගන්නා පුද්ගලයා පිළිබඳව කිසියම් ඇගයීමක් සිදු වේ. නමුත් ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමයේ දී එවැනි කිසිදු පාලනයක් දැකගත නොහැකිය. ඒ හේතුවෙන් මෙම ණය ලබාදීම අසීමිතව සිදු වේ. මෙය ඉතා භයානක තත්වයකි.

එසේම ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය තුළ සිදු වූ ඉතා විශාල හැරවුම් ලක්ෂයන් දෙකක් ලෙස සුනාමිය සහ යුද්ධය අවසන්වීම හඳුන්වා දිය හැකිය. සුනාමි ව්‍යසනයේ දී ජාත්‍යන්තර වශයෙන් විශාල ලෙස මුදල් මෙරටට ගලා ඒම සිදු විය. එසේම 2009දී යුද්ධය නැවතීමෙන් පසු මෙම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන උතුරු සහ නැගෙනහිර පළාත්වලට සංක්‍රමණය වීම සිදුවිය. ඒ හරහා එම ප්‍රදේශවල ජනතාවද පාරිභෝගිකයන් ලෙස මෙම ණය දැලට හසුකර ගැනීමට ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලට හැකියාව ලැබුණි.

මේවන විට මෙය වසංගතයක් දක්වා ලංකාව පුරා පැතිරී ඇත. ප්‍රමාණවත් රාජ්‍ය මැදිහත්වීමකින් තොරව ක්‍රියාත්මක වන මූල්‍ය ආයතන ගම් දනව් සිසාරා දුප්පත්කමේ පතුලට ගිලී සිටින ගැහැනුන් සහ පිරිමින් ඉලක්ක කරගනිමින් මෙම ණය දීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මේ වන විට ඔවුන් ණය ගෙවා ගත නොහැකිව සියදිවි හානි කරගන්නා තත්වයට පත්ව තිබේ.

මෙම මූල්‍ය ආයතන විසින් අසාධාරණ ලෙස අයකර ගන්නා පොලිය හේතුවෙන් මේ තත්වය තවත් උග්‍ර වී තිබේ.

'ග්‍රාමීය ස්ත්‍රීන් සවිබල ගැන්වීම', 'ග්‍රාමීය දුප්පතුන් සවිබල ගැන්වීම' යනුවෙන් ආරම්භ කළ ව්‍යාපෘතිය මේ වන විට ග්‍රාමීය පීඩාවට පත් මිනිසුන් සිය දිවි හානි කරගන්නා තත්වයට ඇද දමා තිබේ. මෙහි බරපතළම තත්වය වන්නේ රජය මේ වන විට ද ඒ සඳහා කිසිදු මැදිහත්වීමක් නොකිරීමයි. ඒ අතරම මහබැංකුවම පිළිගන්නා පරිදි 35% ක් තරම් අතිවිශාල පොලියක් ඔවුන්ට ගෙවීමට ද සිදුවී ඇත. එය මහ දවල් මංකොල්ල කෑමකි. ඒ අනුව මේ වන විටත් මේ ණය ගත් සියලුම ගැහැනුන් සහ පිරිමින් තමන් ගත් සියලු ණය සහ ඊට අදාළ පොළී ගෙවා අවසන් වී ඇත. සත්‍ය වන්නේ මෙම මූල්‍ය ආයතන දැන් මෙම දුප්පත් මිනිසුන්ට ණයගැතිය. අප සමාජයක් ලෙස මේ අත්විඳින්නේ තවත් එක් ඛේදවාචකයක පැතිකඩක් පමණි. දුප්පත්කම දඩමීමා කරගනිමින් මිනිසුන් සූරාකෑමට අවශ්‍ය ලෙස මූල්‍ය ආයතනවලට පහසුකම් සපයන ලංකාවේ පාලකයන්ට මෙම තත්වය අදාළ වන්නේ ම නැත.

එහෙත් අප සමාජයක් ලෙස වහා මීට මැදිහත් නොවුණහොත් හෙට දවසේ පවුල් පිටින් මහ පොළොවේ වැළලී යාම වැළැක්විය නොහැක. එම නිසා මෙම අසාධාරණ ක්ෂුද්‍ර මූල්‍ය ණය අහෝසි කිරීමට අවශ්‍ය කරන ඉක්මන් මැදිහත්වීමක් සමාජයක් ලෙස ම කිරීමට අවශ්‍ය කරන බල කිරීම අප විසින් වහ වහා කළ යුතුය.

**ස්කැන්ඩිනේවියා රටවල් පිළිබඳ ලිපිය මෙවර පළ නොවේ**

එම ලිපියේ ඉතිරි කොටස් ඉදිරි කලාපවලින් බලාපොරොත්තු වන්න.

# වම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

2021 මැයි





සමරු ආචාර පෙළපාළියේ තූර්ය වාදක කණ්ඩායම...



1971 අප්‍රේල් අරගලය, 50 වැනි සමරු භූමිය



සමරුවට එක්වූ පරම්පරා තුනක්...




චමීර කොස්වත්ත සහෝදරයා, සමරු දේශනය ඉදිරිපත් කරමින්...

1971 අප්‍රේල් අරගලයේ 50 වැනි සමරුව වෙනුවෙන් පෙ.ස.ප. විසින් අප්‍රේල් 5 වැනිදා තිස්මහරාමයේ පැවැත්වූ සමරු වැඩසටහනේ අවස්ථා



සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය වෙනුවෙන් ...



සමරු වේදිකාවේ 71 පරපුර නියෝජනය කරමින් ...



සමරු ආචාර පෙළපාළිය ඉදිරියට ඇදෙයි.....


අංක 22/1, මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ යන ලිපිනයේ පදිංචි පුබුදු ජයගෙඩ වන මා විසින් අංක 271/, රත්නපුර පාර, හොරණ හි පිහිටි ස්ටාර් ප්‍රින්ටර්ස් හි මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.